## අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ)

## 12 වන සහ 13 වන ශ්‍රේණි

# ආර්ථික විද්‍යාව

## සංශෝධිත විෂය නිර්දේශය

**2012 සිට ක්‍රියාත්මක වේ.**

**(විභාගය පළමුවරට 2012 වර්ෂයේ දී පැවැත්වේ.)**

**ව්‍යාපාර අධ්‍යයන දෙපාර්තමේන්තුව**

**විද්‍යා හා තාක්ෂණ පීඨය**

**ජාතික අධ්‍යාපන ආයතනය**

| | පටුන | පිටු අංකය |
|---|---|---|
| 1.0 | හැඳින්වීම | i |
| 2.0 | විෂය නිර්දේශයේ අරමුණු | ii |
| 3.0 | නිපුණතා හා නිපුණතා මට්ටම්වල සංශෝධනය කරන ලද විෂය අන්තර්ගතය | iii - xiv |
| 4.0 | කාලච්ඡේදවල බර තැබීම | xv |
| 5.0 | සංශෝධිත විෂය නිර්දේශය | 1 - 47 |
| 6.0 | ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය | 48 |
| 7.0 | පාසල් ප්‍රතිපත්ති සහ වැඩසටහන් සංවිධානය | 49-50 |
| 8.0 | තක්සේරුව හා ඇගයීම | 50 |

## 1.0 හැඳින්වීම

නව සහස්‍රකගේ පළමුවන විෂයමාලා ප්‍රතිසංස්කරණ යටතේ 2009 වර්ෂයේ අ.පො.ස. (උසස් පෙළ) විෂයධාරාවට නිපුණතා පාදක විෂයමාලාවක් පාසල් පද්ධතියට හඳුන්වා දෙන ලදි. අ.පො.ස. (උසස් පෙළ) කලා හා වාණිජ විද්‍යා විෂය ධාරවලට අයත් ඉතා වැදගත් ජනප්‍රිය විෂයයක් වන ආර්ථික විද්‍යාව විෂය ක්ෂේත්‍රය තුළ ඇති වී තිබෙන කාලීන වෙනස්වීම් හා ගෝලීය ප්‍රවණතා සැලකිල්ලට ගනිමින් ආර්ථික විද්‍යාව විෂය නිර්දේශය සඳහා නිපුණතා පාදක විෂයමාලාවක් හඳුන්වා දෙන ලදි.

දැනට වසර තුනක් (03) පාසල් පද්ධතිය තුළ මෙම විෂයමාලාව ක්‍රියාත්මක වෙමින් පවතියි. ජාතික අධ්‍යාපන ආයතනය හා අධ්‍යාපන අමාත්‍යාංශය එක්ව ජාතික මට්ටමින් කරන ලද පර්යේෂණයේ නිගමනවලට අනුව නැවත ආර්ථික විද්‍යාව විෂය නිර්දේශය සංස්කරණය කරන ලදි. අ.පො.ස. (උසස් පෙළ ) මට්ටමේ දරුවෙකුට අත්‍යවශ්‍ය යැයි හැඟෙන විෂය අන්තර්ගතය තීරණය කර ගුරුවරයා පන්ති කාමරය තුළ සැබෑ ලෙසම රැඳෙන කාලය ද සැලකිල්ලට ගෙන සංශෝධිත විෂය නිර්දේශය සකස් කර ඇත.

ආර්ථික විද්‍යා විෂය එදිනෙදා මිනිස් ජීවිතයට සමීප සමාජයීය විද්‍යාවකි. විවිධ සමාජයීය විද්‍යා විෂයවලින් මිනිසා සමාජයේ හැසිරෙන ආකාරය විවිධ දෘෂ්ඨි කෝණවලින් අධ්‍යයනය කරන අතර, මිනිසා සමාජයේ හැසිරෙන ආකාරය ආර්ථික විද්‍යා දෘෂ්ඨි කෝණයකින් හැදෑරීම මෙම විෂයයෙන් සිදු කෙරේ. බෙහෝ කළමනාකරණ හා වාණිජ විද්‍යා විෂයන්වලට පදනම වන්නේ ද ආර්ථික විද්‍යාව බව පැවසිය හැකි ය. එහෙයින් මෙම විෂයය හදාරණ සිසුන්ට උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අවස්ථා ද සුලභ වේ. බොහෝ වාණිජ, කළමනාකරණ හා ගිණුම්කරණ වෘත්තීය පාඨමාලාවල දී ආර්ථික විද්‍යාව විෂයක් වශයෙන් හැදෑරීමේ අවස්ථාව සිසුන්ට ලැබේ. එමෙන් ම ආර්ථික විද්‍යාව, මිනිස් ජීවිතයට සමීප විෂයයක් වන හෙයින් මෙම විෂය ඉගෙන ගන්නා සිසුන්ට සමාජයේ ජීවත්වීම සඳහා හොඳ පදනමක් සපයනු ඇත. මෙම විෂය සාර්ථක ව හදාරන සිසුන් ශ්‍රී ලංකා ආර්ථිකයේ තිරසාර සංවර්ධනයට කාර්යක්ෂම ව හා ඵලදායී ව දායක විය හැකි නිපුණතාවලින් හෙබි පුරවැසියන් වේ යැයි අපේක්ෂා කෙරේ.

## 2.0 විෂය නිර්දේශයේ අරමුණු

- සමාජයක මූලික ආර්ථික ප්‍රශ්න විද්‍යාත්මක ව විශ්ලේෂණය කිරීම හා එම මූලික ආර්ථික ප්‍රශ්න නිරාකරණය කිරීම පිණිස යොදා ගත හැකි විකල්ප ක්‍රම පිළිබඳ ව විචාරාත්මක අවබෝධයක් ලබාදීම.
- ආර්ථික සංකල්ප හා න්‍යාය යොදා ගනිමින් ප්‍රායෝගික ආර්ථික ප්‍රශ්න හා උපනති විශ්ලේෂණය සඳහා අවශ්‍ය කුසලතා ලබාදීම.
- සාර්ව ආර්ථික විචල්‍යයන්ගේ හැසිරීම හා එම විචල්‍ය අතර පවතින අන්තර් සම්බන්ධතා තේරුම් ගැනීමට සැලැස්වීම.
- වෙළෙඳපොළක ආයතන හා පුද්ගලයන් තාර්කික ව හැසිරෙන ආකාරය විමර්ශණය කිරීමට පෙළඹවීම.
- ආර්ථික විද්‍යානුකූල ව සිතීම සඳහා අවශ්‍ය වන තාර්කික චින්තනය ඇති කිරීම.
- විවිධ ආර්ථික විද්‍යා සංකල්ප පිළිබඳ ව පිළිගත් අර්ථකථන අධ්‍යයනයට අවස්ථා ලබාදීම.
- වෙළෙඳපොළ ක්‍රමයක් ඔස්සේ සාර්ව ආර්ථික අරමුණු ළඟා කර ගැනීම සඳහා රජය මැදිහත් වන ආකාරය පිළිබඳ විමසා බැලීමට යොමු කිරීම.
- පවතින ආර්ථික ප්‍රතිපත්ති විචාරශීලී ව විග්‍රහ කිරීමේ හැකියාව ලබාදීම.
- ආර්ථික සංවර්ධනයේ විවිධත්ව තුලනාත්මක ව විමසීමට අවශ්‍ය කුසලතා ලබාදීම.
- ආර්ථික විද්‍යා විෂය විශ්ලේෂණාත්මක ව පැහැදිලි කිරීම සඳහා අවශ්‍ය මූලික නිපුණතා ලබාදීම.
- අන්තර්ජාතික වෙළෙඳාමේ හා මූල්‍යයේ වැදගත්කම හා ගෝලීයකරණය අතර ඇති සම්බන්ධතාව පෙන්වාදීම.
- ශ්‍රී ලංකා ආර්ථිකයේ කාර්ය සාධනය පිළිබඳ ව විචාරාත්මක ව දැකීමට හැකි කුසලතා වර්ධනය කිරීම.
- සමාජයේ යහ පැවැත්මට කටයුතු කිරීම සඳහා අවශ්‍ය පදනමක් ලබාදීම.
- උසස් අධ්‍යාපනයට යොමුවීම සඳහා යෝග්‍ය පදනමක් ලබාදීම.

## 3.0 නිපුණතා හා නිපුණතා මට්ටම්වල සංශෝධනය කරන ලද විෂය අන්තර්ගතය

| නිපුණතාව හා නිපුණතා මට්ටම් | ඉවත් කිරීම් හා සීමා කිරීම් |
|---|---|
| 1.3 ආර්ථික විග්‍රහ සඳහා ප්‍රස්තාර හා සමීකරණ භාවිත කරයි. | • ඉහත නිපුණතා මට්ටම " වෙළෙඳපොළ විග්‍රහ සඳහා ප්‍රස්තාර හා සමීකරණ භාවිත කරයි." ලෙස වෙනස් කර දෙවන නිපුණතාව යටතේ නිපුණතා මට්ටම 2.2 වෙත ගෙනයාම.<br>• ආර්ථික විචල්‍යයන් භාවිත නොකර X සහ Y විචල්‍යයන් ආශ්‍රයෙන් ප්‍රස්තාර හා සමීකරණ භාවිතයට හුරු කිරීම. |
| 1.7 නිෂ්පාදන හැකියා මායිම ඇසුරින් විවිධ ආවස්ථික පිරිවැය තත්ත්ව ඉදිරිපත් කරයි. | • අඩුවන ආවස්ථික පිරිවැය ඉවත් කිරීම. |
| 1.8 ආර්ථිකයක සම්පත් භාවිතය, නිෂ්පාදන හැකියා මායිම් වක්‍රය ඇසුරෙන් ඉදිරිපත් කරයි. | • 1.9 නිපුණතා මට්ටමෙන් ඉවත් කළ "ඵලදායිතාව අර්ථ දැක්වීම හා ඵලදායිතාව මැනීම " යන කොටස් 1.8 නිපුණතා මට්ටමේ විෂය අන්තර්ගතයට ඇතුළත් කිරීම. |
| 1.9 සාධක ඵලදායිතාව වර්ධනය කළ හැකි ආකාර තර්කානුකූල ව ප්‍රකාශ කරයි. | • මෙම නිපුණතා මට්ටම සම්පූර්ණයෙන් ඉවත් කර එහි "ඵලදායිතාව අර්ථ දැක්වීම හා ඵලදායිතාව මැනීම" කොටස් 1.8 නිපුණතා මට්ටම වෙතට ගෙනයාම. |
| 1.12 විවිධ නිර්ණායක භාවිත කරමින් ආර්ථික පද්ධති වර්ග කරයි. | • " පරිවර්තන ආර්ථික" නිර්වචනයට හා නිදසුන් සැපයීමට පමණක් සීමා කිරීම. |

| නිපුණතාව හා නිපුණතා මට්ටම් | ඉවත් කිරීම් හා සීමා කිරීම් |
|---|---|
| 2.1 ආර්ථික විශ්ලේෂණය අනුව වෙළෙඳපොළ වර්ග කරයි. | • හතරවන නිපුණතාවේ ඇතුළත් පහත සඳහන් කොටස් සාධක වෙළෙඳපොළ යටතට ඇතුළත් කිරීම.<br>• නිෂ්පාදන සාධක සඳහා ඉල්ලුම (ව්‍යුත්පන්න ඉල්ලුම)<br>• නිෂ්පාදන සාධක සඳහා ගෙවීම් (බදුකුලිය, ආර්ථික බදුකුලිය, වැටුප්,පොලී සහ ආර්ථික ලාභය) |
| 2.3 මිල හා ඉල්ලුම් ප්‍රමාණය අතර සම්බන්ධතාව විග්‍රහ කරයි. | • ඉල්ලුම් නීතියට හේතු යටතේ එන " හීනවන ආන්තික උපයෝගිතාව" යන කොටස ඉවත් කිරීම.<br>• ඉල්ලුම් නීතියට පටහැනි අවස්ථා යටතේ එන "සමපේක්ෂණ භාණ්ඩ " යන කොටස ඉවත් කිරීම. |
| 2.5 මිල ඉල්ලුම් නම්‍යතා ප්‍රභේද හඳුනා ගැනීමට නම්‍යතාව ගණනය කරයි. | • චාප මිල ඉල්ලුම් නම්‍යතාව<br>• සූත්‍රය හා ගණනය කොටස් ඉවත් කිරීම |
| 2.15 නිෂ්පාදන බදු, වෙළෙඳපොළ ක්‍රියාකාරිත්වයට බලපාන ආකාරය විමසයි. | • "වටිනාකම් මත බදු පැනවීම" හැඳින්වීමට පමණක් සීමා කිරීම.<br>• ගණනය කිරීම සහ බදුවල බලපෑම් ඉදිරිපත් කිරීම, ඒකක බද්දට පමණක් සීමා කිරීම. |

| නිපුණතාව හා නිපුණතා මට්ටම් | ඉවත් කිරීම් හා සීමා කිරීම් |
|---|---|
| 2.16 ඉල්ලුම් නම්‍යතාව හා සැපයුම් නම්‍යතාව අනුව බදු බර බෙදී යන ආකාරය විග්‍රහ කරයි. | • ඒකක බද්දක් ආශ්‍රයෙන් පමණක් බදු බර බෙදීයාම/ බදු ආපාතය පැහැදිලි කිරීම<br>• ඒකක බද්දක් ආශ්‍රයෙන් පමණක් ඉල්ලුම් හා සැපයුම් නම්‍යතාව අනුව බදු බර බෙදීයාම පැහැදිලි කිරීම. |
| 2.17 නිෂ්පාදන සහනාධාර වෙළෙඳපොළ ක්‍රියාකාරිත්වයට බලපාන ආකාරය විමසයි. | • නිෂ්පාදකයාට ලබාදෙන වට්නාකම් මත සහනාධාරය කෙටියෙන් හැඳින්වීමට පමණක් සීමා කිරීම.<br>• සහනාධාරවල බලපෑම ඉදිරිපත් කිරීම ඒකක සහනාධාරයට පමණක් සීමා කිරීම.<br>• ඉල්ලුම් හා සැපයුම් නම්‍යතාව අනුව සහනාධාරයේ වාසිය බෙදීයාම ඒකක සහනාධාරය ආශ්‍රයෙන් පැහැදිලි කිරීම. |
| 3.1 නිෂ්පාදන ක්‍රියාවලියේ ස්වභාවය විශ්ලේෂණය කරයි. | • නිෂ්පාදන සංවිධාන<br>  • නිෂ්පාදන ආයතන<br>  • ව්‍යාපාර සංවිධාන<br>• පරිමාණානුකූල ඵල න්‍යාය යටතේ පවතින "(ලේඛනයක් ආශ්‍රයෙන්)" යන කොටස ඉවත් කිරීම |

| නිපුණතාව හා නිපුණතා මට්ටම් | ඉවත් කිරීම් හා සීමා කිරීම් |
| --- | --- |
| 4.0 සාධක වෙළෙඳපොළ හැසිරීම විශ්ලේෂණය කරයි. | • නිපුණතාව සම්පූර්ණයෙන් ඉවත් කිරීම |
| 5.1 සාර්ව ආර්ථික කළමනාකරණය සඳහා ආර්ථික ප්‍රතිපත්ති යොදා ගන්නා ආකාරය විමසා බලයි. | • මෙම නිපුණතා මට්ටම " සාර්ව ආර්ථික අරමුණු විමසා බලයි. "ලෙස වෙනස් කිරීම.<br>• සාර්ව ආර්ථික ප්‍රතිපත්ති<br>• මූල්‍ය ප්‍රතිපත්ති<br>• රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති<br>• ආදායම් ප්‍රතිපත්ති<br>  • සමස්ත සැපයුම් ප්‍රවර්ධන ප්‍රතිපත්ති<br>  • ඍජු පාලන ප්‍රතිපත්ති<br>  • විදේශ වෙළෙඳ ප්‍රතිපත්ති<br>යන කොටස් විෂය නිර්දේශයේ වෙනත් ස්ථානවල දී සාකච්ඡා වන බැවින් මෙම නිපුණතා මට්ටමින් ඉවත් කිරීම. |
| 5.6 වියදම් ප්‍රවේශයට අනුව ජාතික ගිණුම් සකස් කිරීමේ සූදානම ප්‍රදර්ශනය කරයි. | • මුළු සම්පත් සහ ඒවායේ උපයෝජනය ලංකාවේ සංඛ්‍යා දත්ත ඇසුරෙන් පැහැදිලි කිරීම. |

| නිපුණතාව හා නිපුණතා මට්ටම් | | ඉවත් කිරීම් හා සීමා කිරීම් |
|---|---|---|
| 5.7 | ආදායම් ප්‍රවේශය අනුව ජාතික ගිණුම් සකස් කිරීමේ සූදානම ප්‍රදර්ශනය කරයි. | • විදේශ ගිණුම් හා ජාතික ගිණුම් අතර සම්බන්ධතාව කෙටියෙන් හැඳින්වීමට පමණක් සීමා කිරීම.<br>• දළ දේශීය ඉතුරුම් සහ ජාතික ඉතුරුම් ශ්‍රී ලංකාවේ සංඛ්‍යා දත්ත ඇසුරෙන් පැහැදිලි කිරීම. |
| 5.8 | ජාතික ගිණුම්වල ප්‍රායෝගික භාවිත විමසයි. | • මෙම නිපුණතා මට්ටමේ<br>  • ශ්‍රී ලංකාවේ ජාතික ගිණුම්<br>  • ජාතික නිමැවුමේ සංයුතිය හා මෑතකාලීන වෙනස්වීම්<br>  • කෘෂිකාර්මික, කාර්මික හා සේවාවල ආංශික දායකත්වය<br>  • කෘෂිකාර්මික, කාර්මික හා සේවා අංශයන්හි මෑතකාලීන ප්‍රවණතා<br>  • ජාතික නිමැවුම බෙදාහැරීම.<br>  • ඒකපුද්ගල නිමැවුම/ ආදායම<br>  යන කොටස් විෂය නිර්දේශයේ වෙනත් ස්ථානවල දී සාකච්ඡා කෙරෙන බැවින් ඉවත් කර පහත සඳහන් කොටස් ඇතුළත් කිරීම.<br>  • ආර්ථික වෘද්ධිය මැනීම.<br>  • ඒක පුද්ගල ප්‍රතිශීර්ෂ ආදායම<br>  • ආංශික දායකත්වය<br>• 5.9 නිපුණතා මට්ටමෙහි විෂය අන්තර්ගතය මෙම නිපුණතා මට්ටමට එකතු කිරීම. |
| 5.9 | ජාතික ගිණුම්වල සීමා මතුකර දක්වයි. | • 5.9 නිපුණතා මට්ටම ඉවත් කර නිපුණතා මට්ටමේ අන්තර්ගතය 5.8 නිපුණතා මට්ටම වෙත ගෙනයාම. |

| නිපුණතාව හා නිපුණතා මට්ටම් | ඉවත් කිරීම් හා සීමා කිරීම් |
| --- | --- |
| 6.5 විවෘත ආර්ථිකයක සමතුලිතය තීරණය වන ආකාරය විමසයි. | • පරිභෝජනය ශ්‍රිතය (C)<br>• ඉතුරුම් ශ්‍රිතය<br>• ආයෝජන (I)<br>• රාජ්‍ය වියදම<br>  • රජයේ මිලදී ගැනීම (G)<br>  • සංක්‍රාම (TR)<br>  • ස්වායත්ත බදු (T)<br>යන කොටස් 6.4 නිපුණතා මට්ටමේ දී සාකච්ඡා කෙරෙන බැවින් 6.5 නිපුණතා මට්ටමෙන් ඉවත් කිරීම. |
| 7.1 සාමාන්‍ය මිල මට්ටමට ආශ්‍රීත මිනුම් විග්‍රහ කරයි. | • " මිල දර්ශක" කෙටියෙන් හැඳින්වීමට පමණක් සීමා කිරීම. |
| 7.2 ශ්‍රී ලංකාවේ සාමාන්‍ය මිල මට්ටමේ වෙනස්වීම මනින මිල දර්ශක විමසා බලයි. | • " ශ්‍රී ලංකාවේ පාරිභෝගික මිල දර්ශකය" කොටස ඉවත් කිරීම. |

| නිපුණතාව හා නිපුණතා මට්ටම් | ඉවත් කිරීම් හා සීමා කිරීම් |
|---|---|
| 7.4 උද්ධමනය විග්‍රහ කරන විවිධ ප්‍රවේශ අනුසාරයෙන් උද්ධමනයට බලපාන හේතු සහ ප්‍රතිවිපාක විශ්ලේෂණය කරයි. | • ව්‍යුහාත්මක උද්ධමනය ඉවත් කිරීම. |
| 8.3 ශ්‍රී ලංකාවේ මුදල් සැපයුම විශ්ලේෂණාත්මක ව පරීක්ෂා කරයි. | • පුළුල් මුදල් සැපයුම ($M_5$) ඉවත් කිරීම<br>• මහ බැංකුවේ වත්කම් ඇසුරෙන්<br>• මහ බැංකුවේ වගකීම ඇසුරෙන් වෙනුවට "මහ බැංකුවේ වත්කම් හා වගකීම් ඇසුරෙන්"ලෙස වෙනස් කිරීම. |
| 8.4 ශ්‍රී ලංකාවේ මූල්‍ය පද්ධතිය වර්ග කරයි. | • මෙම නිපුණතා මට්ටමේ<br>• ශ්‍රී ලංකා මහ බැංකුව<br>• බලපත්‍රලාභී වාණිජ බැංකු<br>• බලපත්‍රලාභී විශේෂිත බැංකු<br>• ලියාපදිංචි මූල්‍ය සමාගම්<br>• සමුපකාර ග්‍රාමීය බැංකු<br>• සකසුරුවම් හා ණය දෙන සමුපකාර සමිති<br>• විශේෂිත කල්බදු සමාගම්<br>• ප්‍රාථමික වෙළෙඳුන්<br>• වණික් බැංකු<br>• කොටස් තැරැව්කාර සමාගම්<br>• ඒකක භාර<br>• ව්‍යවසායක ප්‍රාග්ධන සමාගම්<br>• ණය ශ්‍රේණිගත කිරීමේ ආයතන<br>• රක්ෂණ සමාගම්<br>• සේවක අර්ථසාධක අරමුදල |

| නිපුණතාව හා නිපුණතා මට්ටම් | ඉවත් කිරීම් හා සීමා කිරීම් |
|---|---|
| | • සේවක භාරකාර අරමුදල<br>• අනිකුත් අර්ථසාධක අරමුදල්<br>• රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල<br>යන කොටස් ඉවත් කිරීම. |
| 8.7 ශ්‍රී ලංකාවේ මූල්‍ය ප්‍රතිපත්ති උපකරණවල භාවිත විමසයි. | • මූල්‍ය ප්‍රතිපත්ති සම්ප්‍රේෂණ යාන්ත්‍රණය ඉවත් කිරීම. |
| 8.8 ශ්‍රී ලංකාවේ මූල්‍ය වෙළෙඳපොළ විශ්ලේෂණය කරයි. | • ප්‍රාග්ධන වෙළෙඳපොළ<br>• අර්ථ දැක්වීම<br>• ප්‍රාග්ධන වෙළෙඳපොළට අයත් ආයතන<br>යන කොටස් ඉවත් කිරීම. |

| නිපුණතාව හා නිපුණතා මට්ටම් | ඉවත් කිරීම් හා සීමා කිරීම් |
|---|---|
| 10.1 අන්තර්ජාතික වෙළෙඳාමට පදනම් වූ සාධක විමර්ශනය කරයි. | • අන්තර්ජාතික වෙළෙඳාමේ දී වාසි, ස්ථිතිය සහ ගතික ලෙස වෙන වෙන ම සාකච්ඡාකිරීමට අවශ්‍ය නොවන බැවින්<br>• ස්ථිතික වාසි<br>• ගතික වාසි<br>• තාක්ෂණික දැනුම හුවමාරුව<br>• කළමනාකරණ දක්ෂතා හුවමාරුව<br>යන කොටස් ඉවත් කිරීම. |
| 10.2 අන්තර්ජාතික වෙළෙඳාමේ දී ආරක්ෂණවාදී ප්‍රතිපත්තිවලින් ඇති කරන බලපෑම් විශ්ලේෂණය කරයි. | • (GSP+) වෙළෙඳ වරණ පිළිබඳ පොදු ක්‍රමය ඉවත් කිරිම |
| 10.9 අන්තර්ජාතික ආර්ථික සහයෝගීතාව සඳහා ක්‍රියාත්මක වන විවිධ ආර්ථික සංවිධානවල වැදගත්කම විමසයි. | • ආර්ථික ඒකාබද්ධවීම හැඳින්වීමට පමණක් සීමා කිරීම.<br>• ආර්ථික ඒකාබද්ධවීම් යටතේ එන පහත සඳහන් උප මාතෘකා ඉවත් කිරීම.<br>• වර්ණාත්මක වෙළෙඳ පිළිවෙත් (GSP+)<br>• නිදහස් වෙළෙඳ ප්‍රදේශ<br>• තීරුබදු සංගම් |

| නිපුණතාව හා නිපුණතා මට්ටම් | ඉවත් කිරීම් හා සීමා කිරීම් |
|---|---|
| | • පොදු වෙළෙඳපොළ<br>• ආර්ථික සංගම්<br>• ශ්‍රී ලංකාව හා ඉන්දියාව අතර යෝජිත විස්තීර්ණ ආර්ථික සහයෝගිතා ගිවිසුම (CEPA)<br>• ද්වි පාර්ශ්වීය සහ බහු පාර්ශ්වීය වෙළෙඳ ගිවිසුම්වලට මෙහි ඇතුළත් කර ඇති නිදසුන්වලට අමතර ව මෙම ක්ෂේත්‍රයට අදාළ කාලානුරූපී වෙනස්වීම් පිළිබඳ අවබෝධය වැදගත් වේ. |
| 10.10 අන්තර්ජාතික මූල්‍ය ආයතනවල කාර්යය විමසයි. | • ආසියානු සංවර්ධන බැංකුව (ADB) ඉවත් කිරීම.<br>• අන්තර්ජාතික මූල්‍ය අරමුදල (IMF)<br>• ලෝක බැංකු මූළුව (WBG)<br>යන ආයතනවල අරමුණු සහ කාර්යයන් පිළිබඳ හැඳින්වීමට පමණක් සීමා කිරීම. |
| 10.11 සංවර්ධනය වෙමින් පවතින රටවල ගෝලීයකරණයෙන් ඇති වන බලපෑම විග්‍රහ කරයි. | • " ඓතිහාසික ක්‍රියාවලියක් ලෙස ගෝලීයකරණය" කොටස ඉවත් කිරීම. |
| 11.3 සංවර්ධනයේ විවිධත්වය තුලනාත්මක ව විග්‍රහ කරමින් තිරසර සංවර්ධනය අගය කරයි. | • මෙම නිපුණතා මට්ටම " ආර්ථික පිළිබඳ ලෝක බැංකු වර්ගීකරණය තුලනාත්මක ව විග්‍රහ කරමින් තිරසර සංවර්ධනය අගය කරයි." ලෙස වෙනස් කිරීම.<br>• ආර්ථික පිළිබඳ අන්තර්ජාතික වර්ගීකරණය ආර්ථික පිළිබඳ ලෝක බැංකු වර්ගීකරණය ලෙස වෙනස් කිරීම.<br>• ලෝක බැංකු වර්ගීකරණය<br>• අනෙකුත් වර්ගීකරණය<br>• සංවර්ධනය පිළිබඳ ජාත්‍යන්තර විවිධත්ව යන කොටස් ඉවත් කිරීම. |

| නිපුණතාව හා නිපුණතා මට්ටම් | ඉවත් කිරීම් හා සීමා කිරීම් |
|---|---|
| 11.5 දරිද්‍රතා සංකල්පය විග්‍රහ කරමින් එය මිනුම් කරන අයුරු දක්වයි. | • 11.7 නිපුණතා මට්ටමේ පහත සඳහන් කොටස් විෂය අන්තර්ගතයට එකතු කිරීම.<br>• ආර්ථික වර්ධනය සහ දරිද්‍රතාව<br>• දිළිඳු ජනතාවට හිතකර ආර්ථික වෘද්ධි ප්‍රතිපත්ති<br>• මානව දරිද්‍රතා දර්ශකය වෙනුවට බහුමානීය දරිද්‍රතා දර්ශකය ඇතුළත් කිරීම. |
| 11.7 ආර්ථික වර්ධනය හා දරිද්‍රතාව අතර සම්බන්ධතාව විග්‍රහ කරයි. | • 11.5 නිපුණතා මට්ටටමේ දී සාකච්ඡා කෙරෙන බැවින් නිපුණතා මට්ටම සම්පූර්ණයෙන් ඉවත් කිරීම. |
| 11.10 ශ්‍රී ලංකාවේ සේවා නියුක්තියේ හා සේවා වියුක්තියේ ප්‍රමාණාත්මක හා ව්‍යූහාත්මක තත්ත්ව විමසා බලයි. | • සේවා වියුක්තියේ ප්‍රතිවිපාක ඉවත් කිරීම. |
| 11.11 ශ්‍රී ලංකාවේ ශ්‍රම වෙළෙඳපොළ ආශ්‍රිත විවාදිත කරුණු විමසයි. | • නිපුණතා මට්ටම සම්පූර්ණයෙන් ම ඉවත් කිරීම |

| නිපුණතාව හා නිපුණතා මට්ටම් | ඉවත් කිරීම් හා සීමා කිරීම් |
| --- | --- |
| 12.2 නිදහසින් පසු ශ්‍රී ලංකාවේ මුළු සම්පත් සහ එහි උපයෝජනය විමසමින් ආර්ථික වර්ධනයේ රටාව විශ්ලේෂණය කරයි. | • ඉහත නිපුණතා මට්ටම" නිදහසින් පසු ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධනයේ රටාව විශ්ලේෂණය කරයි." ලෙස වෙනස් කිරීම.<br>• මුළු සම්පත්<br>• දළදේශීය නිෂ්පාදිතය<br>• ආනයනය<br>• සම්පත් උපයෝජනය<br>• පරිභෝජනය<br>• ආයෝජනය<br>• ආනයනය<br>• ඉතුරුම්<br>• දේශීය ඉතුරුම්<br>• ජාතික ඉතුරුම්<br>• යන කොටස් 5.6 සහ 5.7 නිපුණතා මට්ටම්වලට ඇතුළත් කොට ඇති නිසා මෙම නිපුණතා මට්ටමෙන් ඉවත් කිරීම. |

## 4.0 කාලච්ඡේදවල බර තැබීම

| අනු අංකය | නිපුණතාව | පවතින කාලච්ඡේද ප්‍රමාණය | අන්තර්ගතය සඳහා කාලච්ඡේද | ක්‍රියාකාරකම් සඳහා කාලච්ඡේද |
|---|---|---|---|---|
| (1) | ආර්ථික පද්ධතියක මූලික ආර්ථික ප්‍රශ්නය විසඳා ගන්නා ආකාරය විශ්ලේෂණය කරයි. | 70 | 58 | 12 |
| (2) | වෙළෙඳපොළක කුටුම්බ ව්‍යාපාර ආයතන තාර්කික ලෙස හැසිරෙන ආකාරය විශ්ලේෂණය කරයි. | 110 | 95 | 15 |
| (3) | වෙළෙඳපොළ තුළ නිෂ්පාදන සංවිධාන තාර්කික ව හැසිරෙන ආකාරය ගවේෂණය කරයි. | 35 | 30 | 05 |
| (4) | සාර්ව ආර්ථික ක්‍රියාකාරිත්වය සැලකිල්ලට ගනිමින් ජාතික ගිණුම් සකස් කිරීමේ සූදානම ප්‍රදර්ශනය කරයි. | 50 | 42 | 08 |
| (5) | සාර්ව ආර්ථික සමතුලිතය තීරණය වන ආකාරය විග්‍රහ කරයි. | 35 | 30 | 05 |
| (6) | සාර්ව ආර්ථික ක්‍රියාකාරිත්වයට බලපාන මිල මට්ටම්වල වෙනස්වීම විශ්ලේෂණය කරයි. | 25 | 19 | 06 |
| (7) | ආර්ථිකයේ ක්‍රියාකාරිත්වයට මුදල් හා බැංකු පද්ධතිය දායක වන ආකාරය විශ්ලේෂණය කරයි. | 48 | 39 | 09 |
| (8) | සාර්ව ආර්ථික අරමුණු ළඟා කර ගැනීමෙහිලා රජය මැදිහත් වන ආකාරය විමර්ශනය කරයි. | 65 | 55 | 10 |
| (9) | විදේශ වෙළෙඳාම හා මූල්‍ය රටක සමස්ත ආර්ථිකයකට ඇති කරන බලපෑම විශ්ලේෂණය කරයි. | 65 | 55 | 10 |
| (10) | සංවිධානයේ විවිධත්වය තුලනාත්මක ව විග්‍රහ කරමින් තිරසාර සංවර්ධනයට දායක වීමේ ඇල්ම ප්‍රදර්ශනය කරයි. | 57 | 47 | 10 |
| (11) | නිදහසෙන් පසු ශ්‍රී ලංකා ආර්ථිකයේ ක්‍රියාකාරිත්වය තුලනාත්මක ව අගයයි. | 40 | 30 | 10 |
| | | 600 | 500 | 100 |

## 5.0 සංශෝධිත විෂය නිර්දේශය

| නිපුණතාව | නිපුණතා මට්ටම් | විෂය අන්තර්ගතය | කාලච්ඡේද |
|---|---|---|---|
| 1. ආර්ථික පද්ධතියක මූලික ආර්ථික ප්‍රශ්නය විසඳා ගන්නා ආකාරය විශ්ලේෂණය කරයි. | 1.1 ආර්ථික විද්‍යාව සමාජයීය විද්‍යාවක් බව තහවුරු කරයි. | • අර්ථික විද්‍යාව නිර්වචනය<br>• ආර්ථික විද්‍යාත්මක ව සිතීම<br>• සමාජයීය විද්‍යාවක් ලෙස ආර්ථික විද්‍යාව<br>• ආර්ථික විද්‍යාව ඉගෙනීමේ වැදගත්කම | **70** |
| | 1.2 තීරණ ගැනීම සඳහා ආර්ථික විද්‍යාවේ න්‍යායාත්මක හා ව්‍යවහාරික පදනම යොදා ගනියි. | • යථානුරූපී හා අභිමතානුරූපී ආර්ථික විද්‍යාව<br>• සූක්ෂ්ම හා සාර්ව ආර්ථික විද්‍යාව<br>• ආර්ථික විද්‍යාවේ ක්‍රමවේදය<br>  • ආකෘති<br>  • උපකල්පන<br>  • න්‍යායයන් | |

| නිපුණතාව | නිපුණතා මට්ටම් | විෂය අන්තර්ගතය | කාලච්ඡේද |
|---|---|---|---|
| | 1.3 භාණ්ඩ හා සේවා පරිභෝජනයෙන් අවශ්‍යතා හා වුවමනා තෘප්තිමත් වන බව පෙන්වා දෙයි. | • මිනිස් අවශ්‍යතා<br>• මිනිස් වුවමනා<br>• අවශ්‍යතා හා වුවමනා අතර වෙනස<br>• භාණ්ඩ හා සේවා<br>  • ආර්ථික භාණ්ඩ<br>  • ආර්ථික නොවන භාණ්ඩ | |
| | 1.4 භාණ්ඩ හා සේවා නිෂ්පාදනයට භාවිතකරන සම්පත් වර්ග කරයි. | • සම්පත්<br>• සම්පත් වර්ග කිරීම<br>  • ආර්ථික සම්පත් හා ආර්ථික නොවන සම්පත්<br>  • ප්‍රතිෂ්ඨාපනය කළ හැකි හා ප්‍රතිෂ්ඨාපනය කළ නොහැකි සම්පත්<br>  • නිෂ්පාදන සාධක<br>    • භූමිය<br>    • ශ්‍රමය<br>    • ප්‍රාග්ධනය<br>    • ව්‍යවසායකත්වය | |
| | 1.5 විකල්ප ප්‍රයෝජන සහිත සීමිත සම්පත්වලින් අසීමිත වුවමනා සපුරා ගැනීමට තාර්කික ව තීරණ ගනියි. | • හිඟකම<br>  • අසීමිත වුවමනා<br>  • සීමිත සම්පත්<br>• විකල්ප ප්‍රයෝජන සහිත ආර්ථික සම්පත්<br>• තෝරා ගැනීම<br>• ආවස්ථික පිරිවැය | |

| නිපුණතාව | නිපුණතා මට්ටම් | විෂය අන්තර්ගතය | කාලච්ඡේද |
|---|---|---|---|
| | 1.6 නිෂ්පාදන හැකියා මායිම ඇසුරින් විවිධ ආවස්ථික පිරිවැය තත්ත්ව ඉදිරිපත් කරයි. | • නිෂ්පාදන හැකියා මායිම<br>  • අර්ථ දැක්වීම<br>  • උපකල්පන<br>  • තීරක<br>• සංඛ්‍යාත්මක ව හා ප්‍රස්තාරික ව ආවස්ථික පිරිවැය ඉදිරිපත් කිරීම.<br>  • ස්ථාවර ආවස්ථික පිරිවැය<br>  • වැඩෙන ආවස්ථික පිරිවැය<br>• වඩාත් තාත්වික තත්ත්වයක් ලෙස වැඩෙන ආවස්ථික පිරිවැය හා ඊට හේතු | |
| | 1.7 ආර්ථිකයක සම්පත් භාවිතය, නිෂ්පාදන හැකියා මායිම් වක්‍රය ඇසුරෙන් ඉදිරිපත් කරයි. | • සම්පත් භාවිතය<br>  • හිඟකම<br>  • සම්පත් පූර්ණ හා උපරිම කාර්යක්ෂම උපයෝජනය<br>  • සම්පත් ඌන උපයෝජනය හා අකාර්යක්ෂම උපයෝජනය<br>• නිෂ්පාදන ධාරිතාවේ වෙනස්වීම (නිෂ්පාදන හැකියාව වෙනස්වීම.)<br>  • සම්පත් සම්භාරය වෙනස්වීම.<br>  • ඵලදායිතාව අර්ථ දැක්වීම හා ඵලදායිතාව මැනීම<br>  • ඵලදායීතාව වෙනස්වීම.<br>    • තාක්ෂණය<br>    • මානව ප්‍රාග්ධනය<br>    • කළමනාකරණය<br>    • ශ්‍රම විභජනය හා විශේෂීකරණය | |

| නිපුණතාව | නිපුණතා මට්ටම් | විෂය අන්තර්ගතය | කාලච්ඡේද |
|---|---|---|---|
| | 1.8 සම්පත් සහ නිමැවුම කාර්යක්ෂම ව බෙදාහැරීම පිළිබඳ තීරණ ගනියි. | • මූලික ආර්ථික ප්‍රශ්න<br>  • සම්පත් වෙන් කිරීම<br>    • කුමක් කොපමණ නිපදවන්නේ ද?<br>  • නිෂ්පාදනය<br>    • කෙසේ නිපදවන්නේ ද?<br>  • නිෂ්පාදිතය බෙදාහැරීම<br>    • කා සඳහා නිපදවන්නේ ද? | |
| | 1.9 ආර්ථික පද්ධතියක තීරණ ගන්නා පාර්ශ්වයන්ගේ හැසිරීම ආදර්ශනය කරයි. | • ආර්ථික පද්ධති<br>  • අර්ථ දැක්වීම<br>  • මූලිකාංග<br>• ආර්ථික පද්ධතියක තීරණ ගන්නා කණ්ඩායම්<br>  • කුටුම්බ<br>  • රජය<br>  • ව්‍යාපාර ආයතන<br>  • වෙනත්<br>    • කම්කරු සංවිධාන<br>    • රාජ්‍ය නොවන සංවිධාන<br>• සම්බන්ධීකරණ යාන්ත්‍රණය<br>  • මිල යාන්ත්‍රණය<br>  • සැලසුම් යාන්ත්‍රණය/ විධාන යන්ත්‍රණය<br>• නීති හා රෙගුලාසි<br>  • නීති රාමුව<br>  • ක්‍රියාමාර්ග<br>  • ප්‍රතිපත්ති<br>  • ප්‍රතිමාන සහ සම්ප්‍රදායයන්<br>  • පුරුදු හා සංස්කෘතිය | |

| නිපුණතාව | නිපුණතා මට්ටම් | විෂය අන්තර්ගතය | කාලච්ඡේද |
|---|---|---|---|
| | 1.10 විවිධ නිර්ණායක භාවිත කරමින් ආර්ථික පද්ධති වර්ග කරයි. | • විවිධ ආර්ථික පද්ධති<br>• ආර්ථික පද්ධති වර්ග කිරීමේ නිර්ණායක<br>• සම්පත් හිමිකාරීත්වය<br>• මූලික ආර්ථික ප්‍රශ්න සම්බන්ධීකරණ යාන්ත්‍රණය<br>• සානුබල සැපයීමේ ස්වරූපය<br>• වෙළෙඳපොළ අර්ථ ක්‍රමය<br>• ලාක්ෂණික<br>• ක්‍රියාකාරීත්වය<br>• මිලෙහි කාර්යභාරය<br>• විධාන අර්ථක්‍රමය<br>• ලාක්ෂණික<br>• ක්‍රියාකාරීත්වය<br>• මිශ්‍ර අර්ථ ක්‍රමය<br>• ලාක්ෂණික<br>• ක්‍රියාකාරීත්වය<br>• පරිවර්තන ආර්ථික<br>පිළිබඳ කෙටි හැඳින්වීම | |

| නිපුණතාව | නිපුණතා මට්ටම් | විෂය අන්තර්ගතය | කාලච්ඡේද |
|---|---|---|---|
| 2. වෙළෙඳපොළක කුටුම්බ හා ව්‍යාපාර ආයතන තාර්කික ලෙස හැසිරෙන ආකාරය විශ්ලේෂණය කරයි. | 2.1 ආර්ථික විශ්ලේෂණය අනුව වෙළඳපොළ වර්ග කරයි. | • වෙළෙඳපොළ<br>• වෙළෙඳපොළ වර්ග<br>  • භාණ්ඩ හා සේවා වෙළෙඳපොළ<br>  • සාධක වෙළෙඳපොළ<br>    • නිෂ්පාදන සාධක සඳහා ඉල්ලුම (ව්‍යුත්පන්න ඉල්ලුම)<br>    • නිෂ්පාදන සාධක සඳහා ගෙවීම්<br>    (බදුකුලිය, ආර්ථික බදුකුලිය, වැටුප්, පොළිය සහ ආර්ථික ලාභය) | 105 |
| | 2.2 වෙළෙඳපොළ විග්‍රහ සඳහා ප්‍රස්තාර හා සමීකරණ භාවිත කරයි. | • විචල්‍ය අතර සම්බන්ධතාව<br>  • ස්වායත්ත විචල්‍යය<br>  • පරායත්ත විචල්‍යය<br>  • ධන හා ඍණ සම්බන්ධතා<br>  • ධන බෑවුම හා ඍණ බෑවුම<br>• ප්‍රස්තාර හා සමීකරණ<br>  • රේඛීය ප්‍රස්තාර<br>  • රේඛීය සමීකරණ | |

| නිපුණතාව | නිපුණතා මට්ටම් | විෂය අන්තර්ගතය | කාලච්ඡේද |
|---|---|---|---|
| | 2.3 වෙළෙඳපොළක ඉල්ලුම තීරණය වීම කෙරෙහි බලපාන සාධක විමසයි. | • ඉල්ලුම<br>• නිර්වචනය<br>  • පෞද්ගලික ඉල්ලුම<br>  • වෙළෙඳපොළ ඉල්ලුම<br>• ඉල්ලුම් න්‍යාය<br>  • පෞද්ගලික ඉල්ලුම<br>  • වෙළෙඳපොළ ඉල්ලුම<br>• ඉල්ලුම් ශ්‍රිතය<br>  • පෞද්ගලික ඉල්ලුම් ශ්‍රිතය<br>  • වෙළෙඳපොළ ඉල්ලුම් ශ්‍රිතය | |
| | 2.4 මිල හා ඉල්ලුම් ප්‍රමාණය අතර සම්බන්ධතාව විග්‍රහ කරයි. | • ඉල්ලුම් නීතිය<br>• ඉල්ලුම් නීතිය ප්‍රකාශ කරන ක්‍රම<br>  • ඉල්ලුම් ලේඛනය<br>  • ඉල්ලුම් වක්‍රය<br>  • ඉල්ලුම් සමීකරණය<br>• ඉල්ලුම් නීතියට හේතු<br>  • ආදායම් ප්‍රතිවිපාකය<br>  • ආදේශන ප්‍රතිවිපාකය<br>• ඉල්ලුම් නීතියට පටහැනි අවස්ථා<br>  • ගිෆන් භාණ්ඩ<br>  • ප්‍රදර්ශනාත්මක භාණ්ඩ | |

| නිපුණතාව | නිපුණතා මට්ටම් | විෂය අන්තර්ගතය | කාලච්ඡේද |
|---|---|---|---|
| | 2.5 ඉල්ලුම් ප්‍රමාණයේ වෙනස්වීම හා ඉල්ලුම වෙනස්වීම අතර වෙනස සන්සන්දනය කරයි. | • ඉල්ලුම් ප්‍රමාණය වෙනස්වීම<br>  • ඉල්ලුම් ප්‍රමාණය වැඩිවීම<br>  • ඉල්ලුම් ප්‍රමාණය අඩුවීම<br>• ඉල්ලුම වෙනස්වීම<br>  • ඉල්ලුම වැඩිවීම<br>  • ඉල්ලුම අඩුවීම | |
| | 2.6 මිල ඉල්ලුම් නම්‍යතා ප්‍රභේද හඳුනා ගැනීමට නම්‍යතාව ගණනය කරයි. | • නම්‍යතා සංකල්පය<br>  • අර්ථ දැක්වීම<br>• මිල ඉල්ලුම් නම්‍යතාව<br>  • අර්ථ දැක්වීම<br>  • ලක්ෂ්‍ය මිල ඉල්ලුම් නම්‍යතාව<br>    • සූත්‍රය හා ගණනය<br>  • සංගුණකය අනුව නම්‍යතා ප්‍රභේද<br>    • පූර්ණ අනම්‍ය<br>    • අනම්‍ය<br>    • ඒකීය නම්‍ය<br>    • නම්‍ය<br>    • පූර්ණ නම්‍ය<br>  • මිල ඉල්ලුම් නම්‍යතාව සහ ඉල්ලුම් වක්‍රයේ බෑවුම<br>• මිල ඉල්ලුම් නම්‍යතාව හා ඉල්ලුම් සමීකරණය | |
| | 2.7 මිල ඉල්ලුම් නම්‍යතාව අනුව වෙළෙඳපොළක තාර්කික ව තීරණ ගන්නා අයුරු විමසයි. | • මිල ඉල්ලුම් නම්‍යතා තීරක<br>• මිල ඉල්ලුම් නම්‍යතාව හා පාරිභෝගික පැහැදම/ ව්‍යාපාරික අය භාරය<br>• මිල ඉල්ලුම් නම්‍යතාවේ ප්‍රායෝගික වැදගත්කම | |

| නිපුණතාව | නිපුණතා මට්ටම් | විෂය අන්තර්ගතය | කාලච්ඡේද |
|---|---|---|---|
| | 2.8 හරස් මිල ඉල්ලුම් නම්‍යතාව අනුව වෙළෙඳපොළක තාර්කික ව තීරණ ගන්නා අයුරු විමසයි. | • හරස් මිල ඉල්ලුම් නම්‍යතාව<br>  • අර්ථ දැක්වීම<br>  • සූත්‍රය හා ගණනය<br>  • සංගුණකය අනුව භාණ්ඩ වර්ග<br>    • ආදේශන භාණ්ඩ<br>    • අනුපූරක භාණ්ඩ<br>• හරස් මිල ඉල්ලුම් නම්‍යතාවයේ ප්‍රායෝගික වැදගත්කම | |
| | 2.9 ආදායම් ඉල්ලුම් නම්‍යතාව අනුව වෙළෙඳපොළක තාර්කික ව තීරණ ගන්නා අයුරු විමසයි. | • ආදායම් ඉල්ලුම් නම්‍යතාව<br>  • අර්ථ දැක්වීම<br>  • සූත්‍රය හා ගණනය<br>  • සංගුණකය අනුව භාණ්ඩ වර්ග කිරීම.<br>    • සාමාන්‍ය භාණ්ඩ<br>      • අත්‍යවශ්‍ය භාණ්ඩ<br>      • සුඛෝපභෝගී භාණ්ඩ<br>    • බාල භාණ්ඩ<br>• ආදායම් ඉල්ලුම් නම්‍යතාවයේ ප්‍රායෝගික වැදගත්කම | |
| | 2.10 වෙළෙඳපොළක සැපයුම තීරණය වීම කෙරෙහි බලපාන සාධක විශ්ලේෂණය කරයි. | • සැපයුම<br>  • අර්ථ දැක්වීම<br>    • ආයතනයක සැපයුම<br>    • වෙළෙඳපොළ සැපයුම | |

| නිපුණතාව | නිපුණතා මට්ටම් | විෂය අන්තර්ගතය | කාලච්ඡේද |
|---|---|---|---|
| | | • සැපයුම් න්‍යාය<br>• සැපයුම් ශ්‍රිතය | |
| | 2.11 මිල හා සැපයුම් ප්‍රමාණය අතර සම්බන්ධතාව විමසයි. | • සැපයුම් නීතිය<br>• සැපයුම් නීතිය ප්‍රකාශ කරන ක්‍රම<br>  • සැපයුම් ලේඛනය<br>  • සැපයුම් වක්‍රය<br>  • සැපයුම් සමීකරණය<br>• සැපයුම් නීතියට හේතු<br>  • වැඩෙන ආවස්ථික පිරිවැය | |
| | 2.12 සැපයුම් ප්‍රමාණය වෙනස්වීම හා සැපයුම වෙනස්වීම අතර වෙනස සන්සන්දනය කරයි. | • සැපයුම් ප්‍රමාණය වෙනස්වීම<br>  • සැපයුම් ප්‍රමාණය වැඩිවීම<br>  • සැපයුම් ප්‍රමාණය අඩුවීම<br>• සැපයුම වෙනස්වීම<br>  • සැපයුම වැඩිවීම හා ඊට හේතු<br>  • සැපයුම අඩුවීම හා ඊට හේතු | |

| නිපුණතාව | නිපුණතා මට්ටම් | විෂය අන්තර්ගතය | කාලච්ඡේද |
|---|---|---|---|
| | 2.13 සැපයුම් මිල නම්‍යතාව අනුව වෙළෙඳපොළක තාර්කික ව තීරණ ගන්නා අයුරු විමසයි. | • සැපයුම් මිල නම්‍යතාව<br>• අර්ථ දැක්වීම<br>• සූත්‍රය හා ගණනය කිරීම<br>• සංගුණකය අනුව සැපයුම් මිල නම්‍යතා ප්‍රභේද<br>• පූර්ණ අනම්‍ය<br>• අනම්‍ය<br>• ඒකීය නම්‍ය<br>• නම්‍ය<br>• පූර්ණ නම්‍ය<br>• සැපයුම් මිල නම්‍යතාව හා සැපයුම් වක්‍රයේ බෑවුම<br>• සැපයුමේ මිල නම්‍යතාව හා සැපයුම් සමීකරණය<br>• සැපයුම් නම්‍යතා තීරක<br>• සැපයුම් නම්‍යතාවේ ප්‍රයෝජන හා ප්‍රායෝගික භාවිතය | |
| | 2.14 වෙළෙඳපොළක මිල තීරණය වන ආකාරය විමසයි. | • වෙළෙඳපොළ සමතුලිතය<br>• අර්ථ දැක්වීම<br>• සමතුලිතය ප්‍රකාශ කළ හැකි ක්‍රම<br>• ඉල්ලුම් හා සැපයුම් ලේඛනය මඟින්<br>• ප්‍රස්තාර මඟින්<br>• සමීකරණ මඟින්<br>• සමතුලිතය ආශ්‍රිත සංකල්ප | |

| නිපුණතාව | නිපුණතා මට්ටම් | විෂය අන්තර්ගතය | කාලච්ඡේද |
|---|---|---|---|
| | | • අධි ඉල්ලුම<br>• අධි සැපයුම<br>• අධි ඉල්ලුම් මිල<br>• අධි සැපයුම් මිල<br>• පාරිභෝගික අතිරික්තය<br>• නිෂ්පාදක අතිරික්තය | |
| | 2.15. ඉල්ලුම හා සැපයුම වෙනස්වීම අනුව වෙළෙඳපොළ සමතුලිතය වෙනස් වන ආකාරය විග්‍රහ කරයි. | • සමතුලිතය වෙනස්වීම<br>• සැපයුම නොවෙනස් ව තිබිය දී ඉල්ලුම වෙනස්වීම.<br>• ඉල්ලුම නොවෙනස් ව තිබිය දී සැපයුම වෙනස්වීම.<br>• ඉල්ලුම හා සැපයුම එකවර වෙනස්වීම | |
| | 2.16 නිෂ්පාදන බදු වෙළෙඳපොළ ක්‍රියාකාරීත්වයට බලපාන ආකාරය විමසයි. | • භාණ්ඩ හා සේවා මත බදු<br>  • ඒකක බද්ද<br>  • වටිනාකම මත බද්ද<br>• ඒකක බද්දක් ආශ්‍රයෙන් බදුවල බලපෑම ඉදිරිපත් කිරීම<br>  • ලේඛනයක් මඟින්<br>  • ප්‍රස්තාරික ව<br>  • සමීකරණය මඟින්<br>• ඒකක බද්දක බලපෑම<br>  • සමතුලිතයට<br>  • පාරිභෝගික පැහැදමට<br>  • නිෂ්පාදක අයභාරයට | |

| නිපුණතාව | නිපුණතා මට්ටම් | විෂය අන්තර්ගතය | කාලච්ඡේද |
|---|---|---|---|
| | | • පාරිභෝගික අතිරික්තයට<br>• නිෂ්පාදක අතිරික්තය<br>• රාජ්‍ය ආදායමට<br>• සමාජ සුභසාධනයට | |
| | 2.17 ඉල්ලුම් නම්‍යතාව හා සැපයුම් නම්‍යතාව අනුව බදු බර බෙදී යන ආකාරය විග්‍රහ කරයි. | • ඒකක බද්දක් ආශ්‍රයෙන් බදු බර බෙදීයාම/ බදු ආපාතය<br>• පාරිභෝගිකයාට<br>• නිෂ්පාදකයාට<br>• ඒකක බද්දක් ආශ්‍රයෙන් ඉල්ලුම් හා සැපයුම් නම්‍යතාව අනුව බදු බර බෙදී යාම. | |
| | 2.18 නිෂ්පාදන සහනාධාර වෙළෙඳපොළ ක්‍රියාකාරීත්වයට බලපාන ආකාරය විමසයි. | • නිෂ්පාදන සහනාධාර<br>• ඒකක සහනාධාරය<br>• වටිනාකම මත සහනාධාරය<br>• ඒකක සහනාධාර ආශ්‍රයෙන් සහනාධාරවල බලපෑම ඉදිරිපත් කිරීම.<br>• ලේඛනයක් මඟින්<br>• ප්‍රස්තාරිකව<br>• සමීකරණය මඟින්<br>• ඒකක සහනාධාරවල බලපෑම<br>• සමතුලිතයට | |

| නිපුණතාව | නිපුණතා මට්ටම් | විෂය අන්තර්ගතය | කාලච්ඡේද |
|---|---|---|---|
| | | • පාරිභෝගික පැහැදමට<br>• නිෂ්පාදක අයහාරයට<br>• පාරිභෝගික අතිරික්තයට<br>• නිෂ්පාදක අතිරික්තයට<br>• රාජ්‍ය වියදමට<br>• සමාජ සුභසාධනයට<br>• ඒකක සහනාධාරයේ වාසිය බෙදීයාම<br>• පාරිභෝගිකයාට<br>• නිෂ්පාදකයාට<br>• ඉල්ලුම් හා සැපයුම් නම්‍යතාව අනුව ඒකක සහනාධාරයේ වාසිය බෙදීයාම | |
| | 2.19 මිල පාලනය වෙළෙඳපොළ ක්‍රියාකාරිත්වයට ඇති කරන බලපෑම විමසයි. | • මිල පාලනය<br>• උපරිම මිල<br>• ප්‍රස්තාරික නිරූපනය<br>• ප්‍රති විපාක<br>• උපරිම මිල අර්ථවත් කර ගැනීමට ගන්නා ක්‍රියා මාර්ග<br>• සලාකනය<br>• ආනයනය<br>• නිෂ්පාදනය දිරිගැන්වීම<br>• අවම මිල<br>• ප්‍රස්තාරික නිරූපනය<br>• ප්‍රති විපාක | |

| නිපුණතාව | නිපුණතා මට්ටම් | විෂය අන්තර්ගතය | කාලච්ඡේද |
|---|---|---|---|
| 3. වෙළෙඳපොළ තුළ නිෂ්පාදන සංවිධාන තාර්කික ව හැසිරෙන ආකාරය ගවේෂණය කරයි. | 3.1 නිෂ්පාදන ක්‍රියාවලියේ ස්වභාවය විශ්ලේෂණය කරයි. | • අව ම මිල අර්ථවත් කර ගැනීමට ගන්නා ක්‍රියාමාර්ග<br>• අතිරික්තය ගබඩා කිරීම<br>• අතුරු නිෂ්පාදනය<br>• පවත්නා ඉල්ලුම ප්‍රවර්ධනය<br>• අපනයනය<br>• සහතික මිල<br>• ප්‍රස්තාරික නිරූපණය<br>• ප්‍රති විපාක<br><br>• නිෂ්පාදන ශ්‍රිතය<br>• කෙටි කාලය<br>• හීන වන ආන්තික ඵලදා න්‍යාය (ලේඛනයක් ආශ්‍රයෙන්)<br>• දිගු කාලය<br>• පරිමාණානුකූල ඵල න්‍යාය<br>• වැඩෙන පරිමාණානුකූල ඵල<br>• ස්ථාවර පරිමාණානුකූල ඵල<br>• අඩුවන පරිමාණානුකූල ඵල | 35 |

| නිපුණතාව | නිපුණතා මට්ටම් | විෂය අන්තර්ගතය | කාලච්ඡේද |
|---|---|---|---|
| | 3.2 විවිධ ප්‍රවේශ භාවිතයෙන් නිෂ්පාදන පිරිවැය ගණනය කරයි. | • නිෂ්පාදන පිරිවැය<br>• නිෂ්පාදන පිරිවැය හා සම්බන්ධ මූලික සංකල්ප<br>  • ආර්ථික පිරිවැය සහ ගණකාධිකරණ පිරිවැය<br>  • ඍජු පිරිවැය සහ වක්‍ර පිරිවැය<br>  • ප්‍රාමාණික ලාභය පිරිවැයක් ලෙස | |
| | 3.3 නිෂ්පාදන ක්‍රියාවලියේ දී පිරිවැය හැසිරෙන ආකාරය විශ්ලේෂණය කරයි. | • කෙටි කාලීන නිෂ්පාදන පිරිවැය<br>  • ස්ථාවර පිරිවැය (FC)<br>  • විචල්‍යය පිරිවැය (VC)<br>  • මුළු පිරිවැය (TC)<br>  • ආන්තික පිරිවැය (MC)<br>  • සාමාන්‍ය පිරිවැය (AC)<br>• කෙටි කාලීන නිෂ්පාදන පිරිවැය ඉදිරිපත් කිරීම<br>  • ලේඛනයක් ඇසුරින්<br>  • ප්‍රස්තාරිකව | |
| | 3.4 මූලික ලක්ෂණ අනුව වෙළෙඳපොළ ව්‍යූහ විමර්ශනය කරයි. | • වෙළෙඳපොළ ව්‍යූහ හා ඒවායේ මූලික ලක්ෂණ<br>  • පූර්ණ තරගය<br>  • ඒකාධිකාරය<br>  • ඒකාධිකාරී තරගය<br>  • කතිපයාධිකාරය | |

| නිපුණතාව | නිපුණතා මට්ටම් | විෂය අන්තර්ගතය | කාලච්ඡේද |
|---|---|---|---|
| | 3.5 පූර්ණ තරගකාරී වෙළෙඳපොළක ආයතනයක් කෙටි කාලයේ දී හැසිරෙන ආකාරය විමසා බලයි. | • පූර්ණ තරගකාරී ආයතනයක ඉල්ලුම් වක්‍රය<br>• කෙටි කාලයේ දී ලාභ උපරිම කිරීම<br>  • මුළු අය භාරය - මුළු පිරිවැය ප්‍රවේශය (සරල ලේඛනයක් මඟින්)<br>  • ආන්තික අය භාරය - ආන්තික පිරිවැය ප්‍රවේශය (සරල ලේඛනයක් මඟින්)<br>• කෙටි කාලයේ දී පූර්ණ තරගකාරී ආයතනයක සමතුලිතය (ප්‍රස්තාරිකව)<br>  • අති ප්‍රාමාණික ලාභ ඉපයීම<br>  • ප්‍රාමාණික ලාභ ඉපයීම<br>  • පාඩු විඳීම<br>• පූර්ණ තරගකාරී ආකෘතිය සත්‍ය වෙළෙඳපොළෙන් අපගමනය වීම. | |
| 4. සාර්ව ආර්ථික ක්‍රියාකාරීත්වය සැලකිල්ලට ගනිමින් ජාතික ගිණුම් සකස් කිරීමේ සූදානම ප්‍රදර්ශනය කරයි. | 4.1 සාර්ව ආර්ථික අරමුණු විමර්ශනය කරයි. | • සාර්ව ආර්ථික අරමුණු<br>  • පූර්ණ සේවා නියුක්තිය<br>  • ආර්ථික ස්ථායිතාව<br>  • සාධාරණත්වය<br>  • ආර්ථික වර්ධනය<br>  • තිරසාර සංවර්ධනය | **50** |

| නිපුණතාව | නිපුණතා මට්ටම් | විෂය අන්තර්ගතය | කාලච්ඡේද |
|---|---|---|---|
| | 4.2 ප්‍රධාන සාර්ව ආර්ථික විචල්‍ය විමර්ශනය කරයි. | • ප්‍රධාන සාර්ව ආර්ථික විචල්‍ය<br>  • ජාතික නිමැවුම<br>  • සේවා නියුක්තිය<br>  • මිල මට්ටම<br>  • ගෙවුම් ශේෂය<br>  • විදේශ විනිමය අනුපාතිකය<br>• ව්‍යාපාර චක්‍ර<br>  • විභව නිමැවුම හා සත්‍ය නිමැවුම<br>  • සංකෝචනය සහ ප්‍රසාරණය | |
| | 4.3 ජාතික ආදායමේ චක්‍රීය ප්‍රවාහය භාවිතයෙන් ජාතික ගිණුම්කරණයේ විවිධ ප්‍රවේශ විග්‍රහ කරයි. | • ජාතික ආදායමේ චක්‍රීය ප්‍රවාහය<br>• ජාතික ගිණුම්කරණ ප්‍රවේශ<br>  • නිමැවුම් ප්‍රවේශය<br>  • ආදායම් ප්‍රවේශය<br>  • වියදම් ප්‍රවේශය<br>• ජාතික ගිණුම්කරණයේ දී බැහැර කළ යුතු අයිතම | |

| නිපුණතාව | නිපුණතා මට්ටම් | විෂය අන්තර්ගතය | කාලච්ඡේද |
|---|---|---|---|
| | 4.4 නිමැවුම් ප්‍රවේශයට අනුව ජාතික ගිණුම් සකස් කිරීමේ සූදානම ප්‍රදර්ශනය කරයි. | • නිමැවුම් ප්‍රවේශය<br>• නිමැවුම ගණනය කිරීම<br>  • බහු ගණන දෝෂය<br>    • බහු ගණන දෝෂය මඟ හරවා ගැනීමේ ක්‍රම<br>      • අවසාන නිමැවුම් ක්‍රමය<br>      • එකතු කළ වටිනාකම් ක්‍රමය | |
| | 4.5 නිමැවුම් ප්‍රවේශය අනුව ජාතික ගිණුම් සකස් කිරීම ආශ්‍රිත විවිධ සංකල්ප තුලනාත්මක ව විමසයි. | • නිමැවුම් ප්‍රවේශයේ විවිධ සංකල්ප<br>  • දළ දේශීය නිෂ්පාදිතය<br>  • දළ ජාතික නිෂ්පාදිතය<br>  • ශුද්ධ දේශීය නිෂ්පාදිතය<br>  • ශුද්ධ ජාතික නිෂ්පාදිතය<br>  • සාධක මිල සහ වෙළෙඳපොළ මිල<br>  • වර්තන මිල සහ ස්ථාවර මිල<br>  • දළ දේශීය නිෂ්පාදිතයේ හා දළ ජාතික නිෂ්පාදිතයේ අවධමනකය | |
| | 4.6 වියදම් ප්‍රවේශයට අනුව ජාතික ගිණුම් සකස් කිරීමේ සූදානම ප්‍රදර්ශනය කරයි. | • වියදම් ප්‍රවේශය<br>  • පරිභෝජනය (C)<br>  • ආයෝජනය (I)<br>  • රාජ්‍ය මිලදී ගැනීම්(G)<br>  • ශුද්ධ අපනයන (NX)<br>  • දළ දේශීය වියදම සහ දළ දේශීය නිෂ්පාදිතය<br>  • දළ ජාතික වියදම<br>  • බහු ගණන දෝෂය මඟහරවා ගැනීමේ ක්‍රම<br>• මුළු සම්පත් සහ ඒවායේ උපයෝජනය<br>(ශ්‍රී ලංකාවේ සංඛ්‍යා දත්ත ඇසුරෙන් පැහැදිලි කිරීම.) | |

| නිපුණතාව | නිපුණතා මට්ටම් | විෂය අන්තර්ගතය | කාලච්ඡේද |
| --- | --- | --- | --- |
| | 4.7 ආදායම් ප්‍රවේශයට අනුව ජාතික ගිණුම් සකස් කිරීමේ සූදානම ප්‍රදර්ශනය කරයි. | • ආදායම් ප්‍රවේශය<br>  • සාධක ආදායම්<br>    • සේවා නියුක්තිකයන්ගේ ආදායම<br>    • බදු කුලී ආදායම<br>    • ශුද්ධ පොළිය<br>    • ලාභය සහ ව්‍යවසායකත්ව ආදායම්<br>  • දේශීය ආදායම<br>  • ජාතික ආදායම<br>  • බහු ගණන දෝෂය වළක්වා ගැනීමේ ක්‍රම<br>  • දළ දේශීය නිෂ්පාදිතය<br>  • පෞද්ගලික ආදායම<br>  • වැය කළ හැකි පුද්ගලික ආදායම<br>  • විදේශ ගිණුම් සහ ජාතික ගිණුම් අතර සම්බන්ධතාව කෙටියෙන් හැඳින්වීම<br>  • වැය කළ හැකි දළ ජාතික ආදායම<br>• මූර්ත ජාතික ආදායම<br>• දළ දේශීය ඉතුරුම් සහ ජාතික ඉතුරුම්<br>(ශ්‍රී ලංකාවේ දත්ත ඇසුරෙන් පැහැදිලි කිරීම.) | |

| නිපුණතාව | නිපුණතා මට්ටම් | විෂය අන්තර්ගතය | කාලච්ඡේද |
|---|---|---|---|
| | 4.8 ජාතික ගිණුම්වල ප්‍රායෝගික භාවිත සහ සීමා මතුකර දක්වයි. | • ජාතික ගිණුම්වල ප්‍රායෝගික භාවිත<br>• ඒක පුද්ගල ප්‍රතිශීර්ෂ ආදායම<br>• ආංශික දායකත්වය<br>• ජාතික ගිණුම්වල සීමා<br>• වෙළෙඳපොළ නොවන ගනුදෙනු<br>• නීති විරෝධි ආර්ථික කටයුතු<br>• නොවිධිමත් ආර්ථික කටයුතු<br>• නිෂ්පාදිතයේ ගුණාත්මක වර්ධනය<br>• පරිසරයට වන බලපෑම සැලකිල්ලට නොගැනීම<br>• පරිසර හායනය<br>• හරිත ජාතික ගිණුම්කරණය | |
| 5. සාර්ව ආර්ථික සමතුලිතය තීරණය වන ආකාරය විග්‍රහ කරයි. | 5.1 සාර්ව ආර්ථික සමතුලිතයට ප්‍රවේශ වීම සඳහා සමාහාර වියදමේ සංරචක විමසයි. | • සමාහාර වියදම් - ආදායම් ප්‍රවේශය<br>• සමාහාර වියදමේ සංරචක හා තීරක<br>• පරිභෝජන වියදම<br>• ආයෝජන<br>• රජය භාණ්ඩ හා සේවා මිලට ගැනීම (රජයේ මිල දී ගැනීම්)<br>• ශුද්ධ අපනයන | 35 |
| | 5.2 සරල ආර්ථිකයක සමතුලිතය තීරණය වන ආකාරය විමසයි. | • සරල ආර්ථිකයක සමතුලිතය<br>• ආදායම් සහ වියදම් ප්‍රවේශය<br>• ගිලිහීම් සහ එකතුවීම් ප්‍රවේශය (කාන්දුවීම් සහ විදීම් ප්‍රවේශය)<br>• පරිභෝජන ශ්‍රිතය<br>• ඉතුරුම් ශ්‍රිතය<br>• ආයෝජනය<br>• සරල ආර්ථිකයක සමතුලිතය ගණනය කිරීම<br>• සංඛ්‍යා ලේඛනයක් මඟින්<br>• ප්‍රස්තාරිකව<br>• සමීකරණ මඟින් | |

| නිපුණතාව | නිපුණතා මට්ටම් | විෂය අන්තර්ගතය | කාලච්ඡේද |
|---|---|---|---|
| | 5.3 සමාහාර ඉල්ලුම් සංරචක වෙනස්වීම මත සරල ආර්ථිකයක සමතුලිතය වෙනස්වීම ගුණක ක්‍රියාවලිය ඇසුරින් පෙන්වා දෙයි. | • සරල ආර්ථිකයක සමතුලිතය වෙනස්වීම<br>  • පරිභෝජන ශ්‍රිතය වෙනස්වීම<br>  • ආයෝජනය වෙනස්වීම<br>• සරල ආර්ථිකයක ගුණක ක්‍රියාවලිය<br>  • ලේඛනයක් මඟින්<br>  • සමීකරණය මඟින්<br>• පූර්ණ සේවා නියුක්ති නිමැවුම් මට්ටම හා සමතුලිත ජාතික ආදායම අතර වෙනස හැඳින්වීම | |
| | 5.4 සංවෘත ආර්ථිකයක සමතුලිතය තීරණය වන ආකාරය විමසයි. | • සංවෘත ආර්ථිකයක සමතුලිතය<br>  • ආදායම් හා වියදම් ප්‍රවේශය<br>  • ගිලිහීම් හා එකතුවීම් ප්‍රවේශය<br>• පරිභෝජන ශ්‍රිතය (C)<br>• ඉතුරුම් ශ්‍රිතය (S)<br>• ස්වායත්ත බදු (T)<br>• රජයේ වියදම්<br>  • රජයේ මිල දී ගැනීම් (G)<br>  • සංක්‍රාම (TR)<br>• ආයෝජනය (I)<br>• සංවෘත ආර්ථිකයක සමතුලිතය ගණනය කිරීම<br>  • සංඛ්‍යා ලේඛනයක් මඟින්<br>  • ප්‍රස්තාරික ව<br>  • සමීකරණ මඟින් | |

| නිපුණතාව | නිපුණතා මට්ටම් | විෂය අන්තර්ගතය | කාලච්ඡේද |
|---|---|---|---|
| | 5.5 විවෘත ආර්ථිකයක සමතුලිතය තීරණය වන ආකාරය විමසයි. | • විවෘත ආර්ථිකයක සමතුලිතය<br>  • ආදායම් සහ වියදම් ප්‍රවේශය<br>  • ගිලිහීම් සහ එකතුවීම් ප්‍රවේශය<br>• ස්වායත්ත ආනයන<br>• අපනයන<br>• විවෘත ආර්ථිකයක සමතුලිතය ගණනය කිරීම.<br>  • සංඛ්‍යා ලේඛනයක් මඟින්<br>  • සමීකරණ මඟින් | 300 |

3.2 - 13 වන ශ්‍රේණිය

## නිපුණතා, නිපුණතා මට්ටම්,විෂය අන්තර්ගතය හා කාලච්ඡේද

| නිපුණතාව | නිපුණතා මට්ටම් | විෂය අන්තර්ගතය | කාලච්ඡේද |
|---|---|---|---|
| 6. සාර්ව ආර්ථික ක්‍රියාකාරීත්වයට බලපාන මිල මට්ටම්වල වෙනස්වීම විශ්ලේෂණය කරයි. | 6.1 සාමාන්‍ය මිල මට්ටම ආශ්‍රිත මිනුම් විග්‍රහ කරයි. | • සාමාන්‍ය මිල මට්ටම<br>• අර්ථ දැක්වීම<br>  • සාමාන්‍ය මිල මට්ටමේ මිනුම්<br>    • මිල දර්ශක පිළිබඳ මූලික හැඳින්වීම | 25 |
| | 6.2 ශ්‍රී ලංකාවේ සමාන්‍ය මිල මට්ටමේ වෙනස්වීම මනින මිල දර්ශක විමසා බලයි. | • ශ්‍රී ලංකාවේ සාමාන්‍ය මිල මට්ටම මනින මිල දර්ශක<br>  • කොළඹ පරිභෝගික මිල දර්ශකය (නව)<br>  • තොග මිල දර්ශකය<br>  • දළ දේශීය නිෂ්පාදිතයේ ආරෝපිත මිල දර්ශකය | |
| | 6.3 උද්ධමනය පිළිබඳ සංකල්ප විග්‍රහ කරමින් උද්ධමන ප්‍රභේද අධ්‍යයනය කරයි. | • උද්ධමනය (inflation)<br>  • අර්ථ දැක්වීම<br>  • උද්ධමන මිනුම්<br>    • මතුපිට උද්ධමනය<br>    • යටිදූරි උද්ධමනය<br>  • උද්ධමන ප්‍රභේද<br>    • ජවන උද්ධමනය (Galloping)<br>    • ප්‍රසර්පණ උද්ධමනය (Creeping) | |

| නිපුණතාව | නිපුණතා මට්ටම් | විෂය අන්තර්ගතය | කාලච්ඡේද |
|---|---|---|---|
| | | • සර්පිල උද්ධමනය (Spiral)<br>• මර්දිත උද්ධමනය (Suppressed)<br>• නිරුද්ධමනය (Disinflation)<br>• අවධමනය (Deflation) | |
| | 6.4 උද්ධමනය විග්‍රහ කරන විවිධ ප්‍රවේශ අනුසාරයෙන් උද්ධමනයට බලපාන හේතු සහ ප්‍රතිවිපාක විශ්ලේෂණය කරයි. | • උද්ධමනය විග්‍රහ කරන විවිධ ප්‍රවේශ<br>• ඉල්ලුමෙන් ඇදුන උද්ධමනය<br>• පිරිවැයෙන් තල්ලු වූ උද්ධමනය<br>• උද්ධමනයේ ප්‍රතිවිපාක<br>• උද්ධමනයේ පිරිවැය | |
| 7. ආර්ථිකයක ක්‍රියාකාරීත්වයට මුදල් හා බැංකු පද්ධතිය දායක වන ආකාරය විශ්ලේෂණය කරයි. | 7.1 මුදල්, මුදල් වර්ග හා මුදලේ කාර්යයන් විමසා බලයි. | • මුදල්<br>• නිර්වචනය<br>• මුදලේ ලාක්ෂණික<br>• මුදල් වර්ග<br>• ව්‍යවහාර මුදල්<br>• බැංකු මුදල්<br>• ආසන්න මුදල්<br>• ආදේශ මුදල්<br>• විද්‍යුත් මුදල් | 45 |

| නිපුණතාව | නිපුණතා මට්ටම් | විෂය අන්තර්ගතය | කාලච්ඡේද |
|---|---|---|---|
| | | • මුදලේ කාර්ය<br>• මුදලේ අගය<br>  • අභ්‍යන්තර අගය<br>  • බාහිර අගය | |
| | 7.2 මුදල් ඉල්ලුම කෙරෙහි බලපාන සාධක ඉදිරිපත් කරයි. | • මුදල් ඉල්ලුම<br>  • අර්ථ දැක්වීම<br>  • මුදල් ඉල්ලුම කෙරෙහි බලපාන සාධක<br>    • ගනුදෙනු චේතනාව<br>    • ආරක්ෂණ චේතනාව<br>    • සමපේක්ෂණ චේතනාව | |
| | 7.3 ශ්‍රී ලංකාවේ මුදල් සැපයුම විශ්ලේෂණාත්මක ව පරීක්ෂා කරයි. | • මුදල් සැපයුම<br>  • අර්ථ දැක්වීම<br>• මූල්‍ය සමස්තයන්<br>  • ඉතා පටු මුදල් සැපයුම ($M_o$)<br>  • පටු මුදල් සැපයුම ($M_1$)<br>  • පුළුල් මුදල් සැපයුම ($M_2$)<br>  • ඒකාබද්ධ පුළුල් මුදල් සැපයුම ($M_{2b}$)<br>  • පුළුල් මුදල් සැපයුම ($M_4$) | |

| නිපුණතාව | නිපුණතා මට්ටම් | විෂය අන්තර්ගතය | කාලච්ඡේද |
|---|---|---|---|
| | | • පදනම් මුදල්<br>  • පදනම් මුදල් සැපයුම තීරණය කරන සාධක<br>    • මහ බැංකුවේ වත්කම් හා වගකීම් ඇසුරෙන්<br>  • මුදල් ගුණකය<br>  • මුදල් සැපයුම තීරණය කරන සාධක | |
| | 7.4 ශ්‍රී ලංකාවේ මූල්‍ය පද්ධතිය වර්ග කරයි. | • බැංකු අංශය<br>• තැන්පතු භාර ගන්නා අනෙකුත් මූල්‍ය ආයතන<br>• අනෙකුත් විශේෂිත මූල්‍ය ආයතන<br>• ගිවිසුම්ගත ඉතිරිකිරීමේ ආයතන | |

| නිපුණතාව | නිපුණතා මට්ටම් | විෂය අන්තර්ගතය | කාලච්ඡේද |
|---|---|---|---|
| | 7.5 බැංකු පද්ධතිය තුළ වාණිජ බැංකුවල කාර්යභාරය විමසයි. | • වාණිජ බැංකු<br>• අර්ථ දැක්වීම<br>• කාර්ය<br>• ද්‍රවශීලතාව හා ලාභදායීත්වය<br>• ශේෂ පත්‍රය<br>• මුදල් මැවීම<br>• මුදල් මැවීම තීරණය කරන සාධක<br>• තැන්පතු ගුණකය | |
| | 7.6 ශ්‍රී ලංකාවේ ප්‍රධාන මූල්‍ය ආයතනය වන ශ්‍රී ලංකා මහ බැංකුවේ කාර්ය භාරය විමසයි. | • ශ්‍රී ලංකා මහ බැංකුව<br>• අර්ථ දැක්වීම<br>• අරමුණු<br>• කාර්ය | |
| | 7.7 ශ්‍රී ලංකාවේ මූල්‍ය ප්‍රතිපත්ති උපකරණවල භාවිත විමසයි. | • මූල්‍ය ප්‍රතිපත්තිය<br>• මූල්‍ය ප්‍රතිපත්ති උපකරණ<br>• ප්‍රමාණාත්මක මූල්‍ය උපකරණ<br>• ප්‍රතිපත්ති පොලී අනුපාතිකය<br>• බැංකු පොලී අනුපාතිකය<br>• ප්‍රති මිල දී ගැනීම් අනුපාතය<br>• ප්‍රති විකුණුම් අනුපාතය | |

| නිපුණතාව | නිපුණතා මට්ටම් | විෂය අන්තර්ගතය | කාලච්ඡේද |
|---|---|---|---|
| | | • ව්‍යවස්ථාපිත සංචිත අනුපාතිකය<br>• විවට වෙළෙඳ පොළ කටයුතු<br>• ගුණාත්මක ණය පාලන උපකරණ<br>• ණය සීමා නියම කිරීම<br>• ණය සඳහා ඇප සුරැකුම් නියම කිරීම<br>• වරණාත්මක පොලී අනුපාතික නියම කිරීම<br>• යහ පෙළඹුම් | |
| | 7.8 ශ්‍රී ලංකාවේ මූල්‍ය වෙළෙඳ පොළ විශ්ලේෂණය කරයි. | • ශ්‍රී ලංකාවේ මූල්‍ය වෙළෙඳ පොළ<br>• අර්ථ දැක්වීම<br>• වර්ග කිරීම<br>• මුදල් වෙළෙඳ පොළ<br>• අර්ථ දැක්වීම<br>• උප මුදල් වෙළෙඳ පොළ | |

| නිපුණතාව | නිපුණතා මට්ටම් | විෂය අන්තර්ගතය | කාලච්ඡේද |
|---|---|---|---|
| 8. සාර්ව ආර්ථික අරමුණු ළඟා කර ගැනීමෙහි ලා රජය මැදිහත් වන ආකාරය විමර්ශනය කරයි. | 8.1 වෙළෙඳ පොළ ක්‍රමය අසමත් වීමට හේතු තාර්කික ව ඉදිරිපත් කරයි. | • වෙළෙඳ පොළ ක්‍රමය අසමත් වීම<br>• වෙළෙඳ පොළ ක්‍රමය අසමත් වීමට හේතු<br>• බාහිරතා<br>• අපූර්ණ තරගය<br>• තොරතුරුවල අපූර්ණත්වය<br>• පොදු භාණ්ඩ නොසැපයීම<br>• අර්ධ පොදු භාණ්ඩ ප්‍රශස්ත ව නොසැපයීම<br>• සුභසාධන භාණ්ඩ ප්‍රශස්ත ව නොසැපයීම<br>• සමාජයට අහිතකර භාණ්ඩ සැපයීම | 65 |
| | 8.2 වෙළෙඳ පොළ ක්‍රමය අසාර්ථක වීම කෙරෙහි බාහිරතාවල බලපෑම් පරීක්ෂා කරයි. | • බාහිරතා<br>• නිෂ්පාදනයේ බාහිරතා<br>• ධන බාහිරතා<br>• සෘණ බාහිරතා | |

| නිපුණතාව | නිපුණතා මට්ටම් | විෂය අන්තර්ගතය | කාලච්ඡේද |
|---|---|---|---|
| | | • පරිභෝජනයේ බාහිරතා<br>  • ධන බාහිරතා<br>  • සෘණ බාහිරතා<br>• බාහිරතා හා වෙළෙඳ පොළ ක්‍රමයේ අසාර්ථකත්වය<br>• බාහිරතා හමුවේ වෙළෙඳ පොළ අසාර්ථක වීම නිවැරදි කිරීමට ගනු ලබන ක්‍රියා මාර්ග | |
| | 8.3 වෙළෙඳ පොළ ආර්ථිකයක රාජ්‍ය කාර්ය භාරය විමසයි. | • වෙළෙඳ පොළ ආර්ථිකයක රාජ්‍ය කාර්ය භාරය<br>  • සම්පත් කාර්යක්ෂම ව බෙදාහැරීම<br>  • ආදායම හා ධනය සාධාරණ ව බෙදාහැරීම<br>  • නීති රීති සම්පාදනය සහ පාලනය<br>  • සාර්ව ආර්ථික ස්ථායිකරණය ඇති කිරීම<br>  • ආර්ථික වර්ධනය සහ තිරසාර සංවර්ධනය ඇති කිරීම<br>  • යටිතල පහසුකම් සැපයීම<br>• රාජ්‍ය අසාර්ථකවීම | |
| | 8.4 සාර්ව ආර්ථික අරමුණු ළඟා කර ගැනීමට රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය යොදාගන්නා ආකාරය විමසයි. | • රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය<br>  • අර්ථ දැක්වීම<br>  • රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති උපකරණ | |

| නිපුණතාව | නිපුණතා මට්ටම් | විෂය අන්තර්ගතය | කාලච්ඡේද |
|---|---|---|---|
| | | • සාර්ව ආර්ථික අරමුණු ඉටු කර ගැනීමට රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය යොදා ගන්නා ආකාරය<br>• පූර්ණ සේවා නියුක්තිය<br>• මිල ස්ථායිතාවය<br>• ආර්ථික වර්ධනය<br>• ගෙවුම් ශේෂ ස්ථායීතාව<br>• ආදායම් හා ධනය බෙදාහැරීමේ සාධාරණත්වය<br>• ධරණීය/ තිරසාර සංර්ධනය<br>• සාර්ව ආර්ථික අරමුණු ඉටුකර ගැනීමේ දී මතුවන ගැටළු | |
| | 8.5 රාජ්‍ය ආදායමේ ප්‍රධාන මූලාශ්‍රයක් ලෙස බදු ක්‍රමය විමසයි. | • රාජ්‍ය ආදායම<br>• බදු ආදායම<br>• බදු නොවන ආදායම<br>• බදු මූලධර්ම<br>• බදු වර්ග<br>• බදු ආපාතය මත බදු වර්ග කිරීම<br>• සෘජු බදු<br>• වක්‍ර බදු<br>• බදු අය කිරීමේ ක්‍රම අනුව බදු වර්ග කිරීම<br>• සමානුපාතික බදු<br>• අනුක්‍රමික බදු<br>• ප්‍රතික්‍රමික බදු | |

| නිපුණතාව | නිපුණතා මට්ටම් | විෂය අන්තර්ගතය | කාලච්ඡේද |
|---|---|---|---|
| | | • බදු ක්‍රමයක ආර්ථික ප්‍රතිවිපාක/ බලපෑම<br>• ශ්‍රී ලංකාවේ රාජ්‍ය ආදායම් ව්‍යුහය<br>• ශ්‍රී ලංකාවේ රාජ්‍ය ආදායමේ උපනති | |
| | 8.6 රාජ්‍ය වියදම් සංයුතිය අධ්‍යයනයෙන් මෑතකාලීන වෙනස්කම් අනාවරණය කරයි. | • රාජ්‍ය වියදම<br>• රාජ්‍ය වියදම් වර්ගීකරණය<br>  • ආර්ථික වර්ගීකරණය<br>    • වර්තන වියදම්<br>    • ප්‍රාග්ධන වියදම්<br>  • කාර්ය බද්ධ වර්ගීකරණය<br>    • සාමාන්‍ය හා පොදු සේවා වියදම්<br>    • සමාජ සේවා වියදම්<br>    • ආර්ථික සේවා වියදම්<br>    • වෙනත් වියදම්<br>• රජයේ වියදම්වල මෑත කාලීන උපනති | |

| නිපුණතාව | නිපුණතා මට්ටම් | විෂය අන්තර්ගතය | කාලච්ඡේද |
|---|---|---|---|
| | 8.7 රාජ්‍ය අය වැය ප්‍රතිපත්තිවල ආර්ථික ප්‍රතිවිපාක විශ්ලේෂණාත්මක ව සොයා බලයි. | • රාජ්‍ය අය වැය ලේඛනය<br>  • අර්ථ දැක්වීම<br>  • ආකෘතිය<br>• හිඟ, අතිරික්ත සහ තුලිත අය වැය<br>• අය වැය ප්‍රතිපත්ති<br>  • ප්‍රසාරණාත්මක අය වැය ප්‍රතිපත්තිය<br>  • සංකෝචනාත්මක අය වැය ප්‍රතිපත්තිය | |
| | 8.8 ශ්‍රී ලංකාවේ රාජ්‍ය අය වැය හා එහි ආර්ථික ප්‍රතිවිපාක විමර්ශනය කරයි. | • ශ්‍රී ලංකාවේ අය වැය<br>  • අය වැය හිඟය<br>  • අය වැය හිඟයට හේතු<br>  • අය වැය හිඟය පියවීම<br>  • අය වැය හිඟයේ ආර්ථික ප්‍රතිවිපාක | |
| | 8.9 ශ්‍රී ලංකාවේ රාජ්‍ය ණය සංයුතිය හා එහි ප්‍රවණතා විමර්ශනය කරයි. | • රාජ්‍ය ණය<br>  • රාජ්‍ය ණය ව්‍යුහය<br>  • රාජ්‍ය ණයෙහි ආර්ථික ප්‍රතිවිපාක<br>  • රාජ්‍ය ණය සේවාකරණ ගෙවීම්<br>  • මෑතකාලීන ප්‍රවණතා | |
| | 8.10 රාජ්‍ය සැපයුම් ප්‍රවර්ධන ප්‍රතිපත්තිවල ආර්ථික ප්‍රතිවිපාක විශ්ලේෂණාත්මක ව සොයා බලයි. | • සැපයුම් ප්‍රවර්ධන ප්‍රතිපත්ති<br>  • අර්ථ දැක්වීම | |

| නිපුණතාව | නිපුණතා මට්ටම් | විෂය අන්තර්ගතය | කාලච්ඡේද |
|---|---|---|---|
| 9. විදේශ වෙළෙඳාම හා මූල්‍ය රටක සමස්ත ආර්ථිකයට ඇති කරන බලපෑම විශ්ලේෂණය කරයි. | 9.1 අන්තර්ජාතික වෙළෙඳාමට පදනම් වූ සාධක විමර්ශනය කරයි. | • සැපයුම් ප්‍රවර්ධන ප්‍රතිපත්තිමය ක්‍රියා මාර්ග<br>  • බදු ප්‍රතිසංස්කරණය<br>  • පෞද්ගලීකරණය<br>  • නියාමනහරණය<br>  • ශ්‍රම වෙළෙඳ පොළ ප්‍රතිසංස්කරණ<br>  • ප්‍රාග්ධන වෙළෙඳ පොළ ප්‍රතිසංස්කරණ<br>• සැපයුම් ප්‍රවර්ධන ප්‍රතිපත්තිවල ආර්ථික ප්‍රතිවිපාක<br>• අන්තර්ජාතික වෙළෙඳාම<br>  • අර්ථ දැක්වීම<br>• අන්තර්ජාතික වෙළඳාමට පදනම් වූ න්‍යාය<br>  • නිරපේක්ෂ වාසි න්‍යාය<br>  • සාපේක්ෂ වාසි න්‍යාය<br>• අන්තර්ජාතික වෙළෙඳාමේ වාසි<br>  • විශේෂිකරණයේ වාසිය<br>  • හුවමාරුවේ වාසිය | 65 |

| නිපුණතාව | නිපුණතා මට්ටම් | විෂය අන්තර්ගතය | කාලච්ඡේද |
|---|---|---|---|
| | 9.2 අන්තර්ජාතික වෙළෙඳාමේ දී ආරක්ෂණවාදී ප්‍රතිපත්තිවලින් ඇති කරන බලපෑම් විශ්ලේෂණය කරයි. | • නිදහස් වෙළෙඳාම<br>• ආරක්ෂණවාදය<br>• ආරක්ෂණවාදී ක්‍රියාමාර්ග<br>• තීරු බදු<br>• තීරු බදු නොවන<br>• ආරක්ෂණවාදී ක්‍රියාමාර්ගවල ප්‍රතිවිපාක/ බලපෑම<br>• ආරක්ෂණ වාදයට පක්ෂ ව හා විපක්ෂ ව ඇති තර්ක<br>• ජාත්‍යන්තර වෙළෙඳාම නියාමනය කරන ආයතන<br>• ලෝක වෙළෙඳ සංවිධානය (WTO) | |
| | 9.3 ශ්‍රී ලංකාවේ විදේශ වෙළෙඳාමේ ව්‍යුහය හා උපනති විමර්ශනය කරයි. | • ශ්‍රී ලංකාවේ අපනයන<br>• ව්‍යුහය<br>• උපනති<br>• ශ්‍රී ලංකාවේ ආනයන<br>• ව්‍යුහය<br>• උපනති | |

| නිපුණතාව | නිපුණතා මට්ටම් | විෂය අන්තර්ගතය | කාලච්ඡේද |
|---|---|---|---|
| | 9.4 වෙළෙඳ අනුපාත ඇසුරින් විදේශ වෙළෙඳාමේ ආර්ථික ප්‍රතිවිපාක විමසයි. | • වෙළෙඳ අනුපාත<br>• වෙළෙඳ අනුපාත වර්ග<br>  • විදේශ වෙළෙඳ අනුපාතය<br>    • ගණනය කිරීම<br>    • ආර්ථික ප්‍රතිවිපාක<br>  • ආදායම් වෙළෙඳ අනුපාතය<br>    • ගණනය කිරීම<br>    • ආර්ථික ප්‍රතිවිපාක | |
| | 9.5 ගෙවුම් ශේෂ ලේඛනයක අන්තර්ගතය විශ්ලේෂණය කරමින් එහි ආකෘතියක් පිළියෙල කරයි. | • ගෙවුම් ශේෂය<br>  • අර්ථ දැක්වීම<br>  • ගෙවුම් ශේෂ ලේඛනයේ සංරචක<br>    • ජංගම ගිණුම<br>      • වෙළෙඳ ගිණුම<br>      • සේවා ගිණුම<br>      • ආදායම් ගිණුම<br>      • වර්තන සංක්‍රාම ගිණුම<br>    • ප්‍රාග්ධන හා මූල්‍ය ගිණුම<br>      • ප්‍රාග්ධන ගිණුම<br>      • මූල්‍ය ගිණුම<br>  • ගෙවුම් ශේෂ ලේඛනයේ ආකෘතිය | |

| නිපුණතාව | නිපුණතා මට්ටම් | විෂය අන්තර්ගතය | කාලච්ඡේද |
|---|---|---|---|
| | 9.6 විදේශ ගනුදෙනු ආර්ථිකයට ඇති කරන බලපෑම ශ්‍රී ලංකාවේ ගෙවුම් ශේෂ ලේඛනය ඇසුරෙන් විග්‍රහ කරයි. | • ශ්‍රී ලංකාවේ ගෙවුම් ශේෂයේ වර්තමාන උපනති<br>• ගෙවුම් ශේෂයේ ආර්ථික ප්‍රති විපාක<br>  • හිඟය<br>  • අතිරික්තය<br>  • ගෙවුම් ශේෂ අර්බුදය හා එයට විසඳුම් | |
| | 9.7 විදේශ විනිමය අනුපාතිකය තීරණය වීම සහ එහි ප්‍රති විපාක විමර්ෂණය කරයි. | • විදේශ විනිමය වෙළඳපොළ<br>• විදේශ විනිමය අනුපාතිකය<br>  • අර්ථ දැක්වීම<br>    • නාමික හා මූර්ත විනිමය අනුපාතිකය (අර්ථ දැක්වීම)<br>    • නාමික සඵල හා මූර්ත සඵල විනිමය අනුපාතිකය (අර්ථ දැක්වීම)<br>  • විදේශ විනිමය අනුපාතය හා එහි ප්‍රති විපාක<br>    • ස්ථාවර විනිමය අනුපාතය<br>    • පාවෙන විනිමය අනුපාතය<br>    • පාලිත නම්‍ය විනිමය අනුපාතය<br>• විනිමය අනුපාතය හා ගෙවුම් ශේෂ ගැළපුම්<br>• මුදල් අවප්‍රමාණය වීම හා ප්‍රතිප්‍රමාණය<br>• විනිමය අනුපාතිකය ක්ෂයවීම හා වර්ධනය | |

| නිපුණතාව | නිපුණතා මට්ටම් | විෂය අන්තර්ගතය | කාලච්ඡේද |
|---|---|---|---|
| | 9.8 විදේශ ආයෝජන රටක ආර්ථිකයට බලපාන ආකාරය විමසයි. | • විදේශ ආයෝජන<br>• විදේශ ආයෝජන වර්ග<br>  • සෘජු ආයෝජන<br>  • කළඹ ආයෝජන<br>• විදේශ ආයෝජනවල ආර්ථික බලපෑම<br>• විදේශ වත්කම්/ බාහිර වත්කම් | |
| | 9.9 අන්තර්ජාතික ආර්ථික සහයෝගීතාවය සඳහා ක්‍රියාත්මක වන විවිධ ආර්ථික සංවිධානවල වැදගත්කම විමසයි. | • ආර්ථික ඒකාබද්ධවීම් හැඳින්වීම<br>• වෙළෙඳ ගිවිසුම්<br>  • ද්වි පාර්ශ්වීය වෙළෙඳ ගිවිසුම්<br>**නිදසුන්:**<br>  • ඉන්දු ශ්‍රී ලංකා වෙළෙඳ ගිවිසුම (ISLFTA)<br>  • පකිස්තානු ශ්‍රී ලංකා නිදහස් වෙළෙඳ ගිවිසුම (PSLFTA)<br>• බහු පාර්ශ්වීය වෙළෙඳ ගිවිසුම්<br>**නිදසුන්:**<br>• බහු ආංශික තාක්ෂණික හා ආර්ථික සහයෝගීතාව උදෙසා බෙංගාල බොක්කේ රටවල මූලිකත්වය (BIMSTEC)<br>• උතුරු ඇමරිකානු නිදහස් වෙළෙඳ ගිවිසුම (NAFTA)<br>• දකුණු ආසියානු නිදහස් වෙළෙඳ ගිවිසුම (SAFTA)<br>• ආසියා ශාන්තිකර වෙළෙඳ ගිවිසුම (AFTA)<br>(වෙළෙඳ ගිවිසුම්වල කාලානුරූපී වෙනස්වීම් පිළිබඳ සාමාන්‍ය අවබෝධය වැදගත් වේ.) | |

| නිපුණතාව | නිපුණතා මට්ටම් | විෂය අන්තර්ගතය | කාලච්ඡේද |
|---|---|---|---|
| | 9.10 අන්තර්ජාතික මූල්‍ය ආයතනවල කාර්යය විමසයි. | • අන්තර්ජාතික මූල්‍ය ආයතනය<br>  • අන්තර්ජාතික මූල්‍ය අරමුදල (IMF)<br>  • ලෝක බැංකු මුළුව (WBG)<br>  (ඉහත ආයතනවල අරමුණු සහ කාර්යය පිළිබඳ මූලික අවබෝධය ප්‍රමාණවත් වේ.) | |
| | 9.11 සංවර්ධනය වෙමින් පවතින රටවලට ගෝලීයකරණයෙන් ඇති වන බලපෑම විග්‍රහ කරයි. | • ගෝලීයකරණය<br>• ගෝලීයකරණයේ ප්‍රධාන ලක්ෂණ<br>• ගෝලීයකරණයේ ගාමක බලවේග<br>• සංවර්ධනය වෙමින් පවතින රටවලට ගෝලීයකරණයේ බලපෑම | |

| නිපුණතාව | නිපුණතා මට්ටම් | විෂය අන්තර්ගතය | කාලච්ඡේද |
|---|---|---|---|
| 10. සංවර්ධනයේ විවිධත්වය තුලනාත්මක ව විග්‍රහ කරමින් තිරසාර සංවර්ධනයට දායකවීමේ ඇල්ම ප්‍රදර්ශනය කරයි | 10.1 ආර්ථික වර්ධනයේ වැදගත්කම අගයමින් ආර්ථික වර්ධනයට ඉවහල් වන සාධක විශ්ලේෂණය කරයි. | • ආර්ථික වර්ධනය<br>  • අර්ථ දැක්වීම<br>  • තීරක (වර්ධනයට දායක වන සාධක)<br>    • සම්පත් සම්භාරය<br>    • සාධක ඵලදායිතාව<br>    • ආර්ථික ස්ථායිතාව<br>    • දේශපාලන ස්ථාවරභාවය<br>    • යහ පාලනය<br>• ආර්ථික වර්ධනය මැනීම<br>• ආර්ථික වර්ධනයත් සමඟ ආර්ථික ව්‍යුහය වෙනස් වීම<br>• ආර්ථික වර්ධනයේ වැදගත්කම<br>• ආර්ථික වර්ධනයේ පිරිවැය | 65 |
| | 10.2 ආර්ථික සංවර්ධන ක්‍රියාවලියක ගුණාංග හා එය මැනීම විග්‍රහ කරයි. | • ආර්ථික සංවර්ධනය<br>  • අර්ථ දැක්වීම<br>  • ආර්ථික සංවර්ධන ක්‍රියාවලිය තුළ තිබිය යුතු ගුණාංග<br>• සංවර්ධනය මැනීමේ දර්ශක | |

| නිපුණතාව | නිපුණතා මට්ටම් | විෂය අන්තර්ගතය | කාලච්ඡේද |
|---|---|---|---|
| | 10.3 ආර්ථික පිළිබඳ ලෝක බැංකු වර්ගීකරණය තුලනාත්මක ව විග්‍රහ කරමින් තිරසර සංවර්ධනය අගය කරයි. | • ආර්ථික පිළිබඳ ලෝක බැංකු වර්ගීකරණ<br>• තිරසර සංවර්ධන සංකල්පය | |
| | 10.4 ආදායම් විෂමතාව මැනීමට යොදා ගන්නා සම්මත ක්‍රම පරීක්ෂා කරයි. | • ආදායම් විෂමතාව<br>  • අර්ථ දැක්වීම<br>• ආදායම් ව්‍යාප්තියේ ස්වරූප<br>  • නිරපේක්ෂ ආදායම් ව්‍යාප්තිය<br>  • සාපේක්ෂ ආදායම් ව්‍යාප්තිය<br>• ආදායම් ව්‍යාප්ති මිනුම්<br>  • ලෝරන්ස් වක්‍රය<br>  • ගිනි සංගුණකය | |

| නිපුණතාව | නිපුණතා මට්ටම් | විෂය අන්තර්ගතය | කාලච්ඡේද |
|---|---|---|---|
| | 10.5 දරිද්‍රතා සංකල්පය විග්‍රහ කරමින් එය මිනුම් කරන අයුරු දක්වයි. | • දරිද්‍රතා සංකල්පය<br>  • අර්ථ දැක්වීම<br>  • නිරපේක්ෂ හා සාපේක්ෂ දරිද්‍රතාව<br>• දරිද්‍රතාවයේ පැතිකඩ<br>  • ආදායම් (පරිභෝජන) දරිද්‍රතාව<br>  • මානව සංවර්ධනයේ දරිද්‍රතාව<br>• දරිද්‍රතාව මැනීම<br>  • ජාතික දරිද්‍රතා ඉම<br>  • ජාත්‍යන්තර දරිද්‍රතා ඉම<br>  • බහුමාන්‍යවය දරිද්‍රතා දර්ශකය<br>• ආර්ථික වර්ධනය සහ දරිද්‍රතාවය අතර සම්බන්ධය<br>  • දිළිඳු ජනතාවට හිතකර ආර්ථික වෘද්ධි ප්‍රතිපත්ති | |
| | 10.6 ශ්‍රී ලංකාවේ දරිද්‍රතාව හා එය අවම කිරීමට ගෙන ඇති ප්‍රයත්න අගය යි. | • ශ්‍රී ලංකාවේ දරිද්‍රතාව<br>  • දරිද්‍රතා මට්ටම්<br>  • ප්‍රාදේශීය වෙනස්කම්<br>  • දරිද්‍රතාවට හේතු<br>  • දරිද්‍රතාව අවම කිරීමට ගෙන ඇති ක්‍රියාමාර්ග | |

| නිපුණතාව | නිපුණතා මට්ටම් | විෂය අන්තර්ගතය | කාලච්ඡේද |
| --- | --- | --- | --- |
| | 10.7 ශ්‍රී ලංකාවේ ජනගහන ව්‍යාප්තිය හා එහි ප්‍රතිවිපාක විමසයි. | • ජනගහනය<br>• ජනගහන වර්ධනය හා එහි තීරක<br>• ජනගහන ව්‍යාප්තියේ වෙනස් වීම් සහ ප්‍රති විපාක<br>  • පුමිතිරි බව<br>  • වයස් ව්‍යූහය<br>  • නාගරික, ග්‍රාමීය සහ වතු | |
| | 10.8 ශ්‍රී ලංකාවේ ශ්‍රම බලකාය ගණනය කරන අයුරු දක්වයි. | • ශ්‍රම බලකාය<br>  • අර්ථ දැක්වීම<br>  • ගණනය කිරීම<br>  • තීරණය වන සාධක<br>    • වැඩ කළ හැකි වයසේ ජනගහනය<br>    • ශ්‍රම බලකා සහභාගීත්ව අනුපාතය | |
| | 10.9 ශ්‍රී ලංකාවේ සේවා නියුක්තියේ හා සේවා වියුක්තියේ ප්‍රමාණාත්මක හා ව්‍යූහාත්මක තත්ත්ව විමසා බලයි. | • සේවා නියුක්තිය<br>    • අර්ථ දැක්වීම<br>    • ව්‍යූහය<br>    • පූර්ණ සේවා නියුක්තිය<br>    • ඌන සේවා නියුක්තිය<br>  • සේවා වියුක්තිය<br>    • අර්ථ දැක්වීම<br>    • ව්‍යූහය<br>    • ශ්‍රී ලංකාවේ සේවා වියුක්තියට හේතු | |

| නිපුණතාව | නිපුණතා මට්ටම් | විෂය අන්තර්ගතය | කාලච්ඡේද |
|---|---|---|---|
| 11. නිදහසින් පසු ශ්‍රී ලංකා ආර්ථිකයේ ක්‍රියාකාරිත්වය තුලනාත්මක ව අගය යි. | 11.1 ශ්‍රී ලංකා ආර්ථිකයේ දළ දේශීය නිෂ්පාදිතය හා සේවා නියුක්තියේ ආංශික සංයුතිය විමසයි. | • දළදේශීය නිෂ්පාදිතය<br>• ආංශික සංයුතිය<br>• රාජ්‍ය හා පෞද්ගලික අංශයේ සාපේක්ෂ සහභාගිත්වය<br>• සේවා නියුක්තිය<br>• ආංශික සංයුතිය<br>• රාජ්‍ය හා පෞද්ගලික අංශයේ සාපේක්ෂ සහභාගිත්වය | 40 |
| | 11.2 නිදහසින් පසු ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධනයේ රටාව විශ්ලේෂණය කරයි. | • නිදහසින් පසු ආර්ථික වර්ධන රටාව<br>• 1948- 1977 දක්වා<br>• 1977න් පසු | |

| නිපුණතාව | නිපුණතා මට්ටම් | විෂය අන්තර්ගතය | කාලච්ඡේද |
|---|---|---|---|
| | 11.3 ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික අංශය හා සම්බන්ධ විවාදිත කරුණු විමර්ශනය කරයි. | • කෘෂිකාර්මික අංශය<br>• ආර්ථික සංවර්ධන ක්‍රියාවලියට කෘෂිකාර්මික අංශයේ දායකත්වය<br>• සමස්ත කාර්ය සාධනය සහ ප්‍රවණතා<br>• දේශීය කෘෂිකර්මයේ විභව්‍යතා හා ගැටළු<br>• වැවිලි කෘෂිකර්මයේ විභව්‍යතා හා ගැටළු<br>• කෘෂි ආශ්‍රිත කර්මාන්ත | |
| | 11.4 ශ්‍රී ලංකාවේ කාර්මික අංශය හා සම්බන්ධ විවාදිත කරුණු විමර්ශනය කරයි. | • කාර්මික අංශය<br>• ආර්ථික සංවර්ධන ක්‍රියාවලියට කාර්මික අංශයේ දායකත්වය<br>• සමස්ත කාර්ය සාධනය සහ ප්‍රවණතා<br>• පෞද්ගලික අංශයේ ප්‍රවණතා<br>• රාජ්‍ය අංශයේ කර්මාන්ත<br>• සුළු හා ක්ෂුද්‍ර ව්‍යවසායකයන්ගේ කාර්යභාරය | |

| නිපුණතාව | නිපුණතා මට්ටම් | විෂය අන්තර්ගතය | කාලච්ඡේද |
|---|---|---|---|
| | 11.5 ශ්‍රී ලංකාවේ සේවා අංශය හා සම්බන්ධ විවාදිත කරුණු විමර්ශනය කරයි. | • සේවා අංශය<br>• ආර්ථික සංවර්ධන ක්‍රියාවලියට සේවා අංශයේ දායකත්වය<br>• ව්‍යූහය සහ ප්‍රධාන ප්‍රවණතා<br>• වර්ධනය සහ ව්‍යූහමය වෙනස් වීම්<br>• යටිතල පහසුකම් ඉලක්ක කරගත් සේවා<br>• ආර්ථික, සමාජයීය හා මූල්‍ය යටිතල පහසුකම්<br>• යටිතල පහසුකම් සංවර්ධනය කිරීමෙහිලා පෞද්ගලික අංශයේ දායකත්වය | |
| | 11.6 සමකාලීන ආර්ථික සිදුවීම් විමර්ශනය කරයි. | • සමකාලීන ආර්ථික සිදුවීම්<br>• දේශීය<br>• ගෝලීය<br>• සමකාලීන ආර්ථික සිදුවීම්වල ප්‍රතිවිපාක | **300** |

## 6.0 ඉගෙනුම්- ඉගැන්වීම් ක්‍රමෝපාය

ආර්ථික විද්‍යාව මගින් මිනිසා සමාජයේ ආර්ථික විද්‍යාත්මක හැසිරෙන ආකාරය අධ්‍යයනය කෙරේ. මෙම විෂය ඉගෙනුම්- ඉගැන්වීම් කටයුතුවල දී සිසුන් ආර්ථික විද්‍යාත්මක ව සිතීමටත්, ඒ අනුව කටයුතු කිරීමටත් උනන්දු කෙරේ. මේ නිසා යෝජිත ඉගෙනුම්- ඉගැන්වීම් ක්‍රියාවලිය වඩාත් ප්‍රායෝගික හා ශිෂ්‍ය කේන්ද්‍රීය වීම අත්‍යවශ්‍ය වේ. ඒ මගින් ශිෂ්‍යයාට ආර්ථික විද්‍යා සංකල්ප සරළ ව ග්‍රහණය කර ගැනීමටත්, ප්‍රායෝගික ව භාවිත කිරීමටත් හැකි වේ යැයි අපේක්ෂා කෙරේ. මේ නිසා දැනුම ආකල්ප හා කුසලතා මෙන් ම හොඳ ජීවන පුරුදු ඇතිකර ගත හැකි ක්‍රමවේද භාවිතයට ගැනීම වැදගත් වේ. මෙම විෂයට අයත් විවිධ න්‍යාය, මූලධර්ම හා පරිචය ලැබිය හැකි සේ ඉගෙනුම්- ඉගැන්වීම් ක්‍රියාවලිය ඵලදායී ව සැලසුම් කර ගත යුතු ය. ආර්ථික විද්‍යාව, මිනිසා ආර්ථික විද්‍යාත්මක හැසිරෙන ආකාරය අධ්‍යයනය කෙරෙන සමාජ විද්‍යාවක් වන හෙයින් විෂයට අදාළ ගැඹුරු, සංකීර්ණ හා වියුක්ත සංකල්ප සිසුන් ජීවත්වන සමාජයෙන්ම අත්දැකීමට සැලැස්විය හැකි වන ඉගෙනුම් ක්‍රමවේද බොහෝ වේ. ඒවා සුදුසු ලෙස තෝරා ගැනීම, ඒ අනුව ක්‍රමවේදය සැලසුම් කර ගැනීම හා ක්‍රියාත්මක කිරීම ගුරුවරයාගෙන් අපේක්ෂා කෙරේ.

නිපුණතා පාදක ව ගොඩනගා ඇති මෙම විෂය නිර්දේශයේ ඇතුළත් ඒ ඒ නිපුණතා මට්ටම් ළඟා කර ගැනීම සඳහා ගවේෂණාත්මක ප්‍රවේශයක් ඔස්සේ සැලසුම් කරන ක්‍රමවේද ක්‍රියාත්මක කරනු ඇතැයි අපේක්ෂා කෙරේ. ශිෂ්‍ය කේන්ද්‍රීය ඉගෙනුම්- ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා ගවේෂණාත්මක ඉගෙනුම් ප්‍රවේශය (Inquiry Based Learning Approach) අත්දැකීම් පදනම් කරගත් ඉගෙනුම් ප්‍රවේශය (Experiential Learning Approach) ස්වනිර්මාණ ඉගෙනුම් ප්‍රවේශය (Constructivist Learning Approach) යන මේවා යොදා ගැනීමට යෝජිත ය. ඒ ඒ ඉගෙනුම් ප්‍රවේශ යටතේ භාවිත කළ හැකි ඉගෙනුම්- ඉගැන්වීම් ක්‍රම සඳහා නිදසුන් පහත දැක්වේ. මෙවැනි ක්‍රම භාවිතයෙන් ප්‍රබෝදාත්මක ඉගෙනුමකට මග සලසා ගත හැකි ය. එමගින් පන්ති කාමරයේ නීරස බව නැතිකර ගත හැකිවේ යැයි විශ්වාස කෙරේ.

- පොත පත පරිශීලනය හා ස්වයං අධ්‍යයනය
- පැවරුම් හා ව්‍යාපෘති
- නිරීක්ෂණය හා ගවේෂණය
- ගැටලු විසඳීම
- සාමූහික ඉගෙනුම් කණ්ඩායම් ක්‍රමය
- බුද්ධි කලම්බනය
- ක්‍රීඩා
- විවාද
- භූමිකා රංගන
- නිබන්ධන
- පුහුණු අභ්‍යාස
- ක්ෂේත්‍ර චාරිකා
- සමරූපනය
- සිද්ධි අධ්‍යයනය
- රූපික සංවිධාන ක්‍රමය (Graphic Organizer)
- ආදර්ශනය
- ක්‍රියාවෙන් ඉගෙනුම්

සැමවිටක ම ගුරුවරයා සුසාධ්‍යකාරකයකු නියාමනය කරන්නකු හා සම්පත් පුද්ගලයකු ලෙසට ඉතා වැදගත් කාර්යභාරයක් ඉටු කළ යුතු ය. ශිෂ්‍යයා නිතර නිර්මාණශීලී හා විචාරශීලී චින්තනයට යොමු කරවන කේවල හෝ සාමූහික හෝ ක්‍රියාකාරකම්, පැවරුම්, ව්‍යාපෘති ආදී ප්‍රායෝගික නැඹුරුවක් ඇති ඉගෙනුම්- ඉගැන්වීම් ක්‍රමෝපා කෙරෙහි විශේෂයෙන් යොමුවනු ඇතැයි අපේක්ෂා කෙරේ.

## 7.0 පාසල් ප්‍රතිපත්ති සහ වැඩසටහන් සංවිධානය

ආර්ථික විද්‍යාව විෂයයේ අපේක්ෂිත අරමුණු හා නිපුණතා ඵලදායී ලෙස සාක්ෂාත් කර ගැනීම සඳහා පන්ති කාමර ඉගෙනුම්- ඉගැන්වීම් ක්‍රියාවලියේ සාර්ථකත්වය බෙහෙවින් ඉවහල් වේ. එබැවින් එයට සරිලන පරිදි පාසල් ප්‍රතිපත්ති හා වැඩසටහන් සංවිධානය කර ගැනීම වැදගත් වේ.

2011 වර්ෂයේ සංශෝධිත විෂය නිර්දේශය අනුව වර්ෂ දෙකකට කාලච්ඡේද 600ක් වෙන් කර ඇති අතර, එය විෂය අන්තර්ගතය සඳහා කාලච්ඡේද 500ක් වන ලෙස ද, ක්‍රියාකාරකම් සඳහා කාලච්ඡේද 100ක් වන ලෙස ද වෙන් කොට ඇත.

ආර්ථික විද්‍යාව විෂය ඉගෙනුම්- ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා යොදා ගත හැකි විවිධ ක්‍රමෝපාය සැලකිල්ලට ගන්නා විට ප්‍රායෝගික නැඹුරුව ඇති විෂය සමගාමී වැඩසටහන් සහ විෂයානුබද්ධ පාසල් ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරිම අත්‍යවශ්‍ය කටයුත්තක් වේ. එමගින් ශිෂ්‍යයාගේ සහජ දක්ෂතා ඉස්මතු කර ගැනීමට සහ නිර්මාණශීලී චින්තනයට ඉඩකඩ විවෘත වේ. ඒ සඳහා යොදා ගත හැකි පාසල් ප්‍රතිපත්ති සහ වැඩසටහන් කෙරෙහි අවධානය යොමු කළ යුතු ය.

**ක්‍රියාත්මක කළ හැකි වැඩසටහන් සඳහා නිදසුන්:**

- වෙළෙඳපොළ නිරීක්ෂණය කොට තොරතුරු රැස් කිරීම.
- ආර්ථික විද්‍යානුකූල ව සිතීමට සිසුන් හුරු කිරීම.
- වාණිජවිද්‍යා සංගම් නියෝජනය කිරීම.
- සමාජයේ අත්දැකීම් පන්ති කාමරයට ගෙනඒම සඳහා සාකච්ඡා හා සම්මන්ත්‍රණ සංවිධානය කිරීම.
- ආර්ථික මධ්‍යස්ථාන, කොටස් වෙළෙඳපොළ වැනි ස්ථාන නිරීක්ෂණය කොට අධ්‍යයනය කිරීම සඳහා ක්ෂේත්‍ර චාරිකා සංවිධානය කිරීම.
- විෂයට අදාළ ව පුවත්පත්වල සහ සඟරාවල පළවෙන ලිපි එකතුවක් පවත්වාගෙන යාම.

- ආර්ථික විද්‍යාවට අදාළ විශ්වීය ප්‍රවණතා අළලා බිත්ති පුවත්පතක් හා සඟරාවක් පවත්වාගෙන යෑමට සිසුන් යොමු කිරීම.
- වෙළෙඳපොළක් සංවිධානය කර පැවැත්වීම මඟින් වෙළෙඳපොළ බලවේග ක්‍රියාත්මක වන ආකාරය අධ්‍යයනය කිරීම.
- මිනිසා ආර්ථික විද්‍යාත්මක ව හැසිරීම තහවුරු කිරීම සඳහා සුදුසු නාට්‍යය නිර්මාණය හා රඟ දැක්වීම.
- තරඟ, සංවාද, විවාද හා සම්මන්ත්‍රණ පැවැත්වීම.
- අන්තර්ජාලය භාවිතයෙන් ආර්ථික විද්‍යාවට අදාළ ව තොරතුරු රැස් කිරීම.
- ආර්ථික විද්‍යාවට අදාළ ව පරිසරයේ කාලීන සිදුවීම් පිළිබඳ ව දැනුවත් කිරීම.

ඉහත දැක්වෙන ආකාරයේ මෙම විෂයට සුවිශේෂ වූ ක්‍රියාකාරකම් හා වැඩසටහන් සංවිධානය කිරීම සඳහා ඒ ඒ පාසලට සුවිශේෂ වූ ප්‍රතිපත්තියක් ගොඩනඟා ගැනීම අවශ්‍ය වේ. මේ නිසා පාසලේ වාර්ෂික වැඩසටහනේ උප වැඩසටහනක් ලෙස මෙම විෂයයට අදාළ ව වර්ෂ දෙකක් සඳහා සුවිශේෂ වැඩසටහනක් හා ප්‍රතිපත්ති සකස් කර ගැනීම සඳහා ආර්ථික විද්‍යා ගුරුවරුන්ගෙන් හා සිසුන්ගෙන් සමන්විත කමිටුවක් පත් කර ගැනීම යෝග්‍ය වේ. එම කමිටුව විසින් උසස් පෙළ සඳහා ආර්ථික විද්‍යා විෂයයට සමගාමී ව කිරීමට අපේක්ෂිත වැඩසටහන් සහ ප්‍රතිපත්ති තීරණය කර පාසලේ වාර්ෂික වැඩසටහන සමඟ ඒකාබද්ධ කිරීම වඩා සුදුසු ය. මේ සෑම අවස්ථාවක දී ම අධ්‍යාපනයේ සැබෑ ගනුදෙනුකරුවන් වන දරුවන් සහ දෙමාපියන්ගේ අවශ්‍යතා ද, රාජ්‍ය ප්‍රතිපත්ති ද පදනම් කර ගත යුතු ය. එමෙන් ම අදාළ සම්පත්, අරමුදල්, පාසල් හා ප්‍රජාව අතර සම්බන්ධය ද මනාව අධ්‍යයනයට භාජනය කිරීම අවශ්‍ය ය.

## 8.0 තක්සේරුව හා ඇගයීම

පාසල පදනම් කරගත් ඇගයීම් වැඩපිළිවෙල යටතේ එක් එක් වාරය සඳහා නියමිත නිපුණතා හා නිපුණතා මට්ටම් ආවරණය වන පරිදි ඉගෙනුම්-ඉගැන්වීම් ඇගයීම් උපකරණ නිර්මාණාත්මක ව පිළියෙල කොට ක්‍රියාත්මක කිරීම අපේක්ෂිත ය.

13 වන ශ්‍රේණිය අවසානයේ දී ජාතික මට්ටමේ ඇගයීම වන අ.පො.ස. (උසස් පෙළ) විභාගය සඳහා මෙම විෂය නිර්දේශය නිර්දේශිත ය. 2011 වර්ෂයේ දී සංශෝධනය කරන ලද මෙම විෂය නිර්දේශය පදනම් කරගෙන, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන ජාතික මට්ටමේ විභාගය පළමුවරට 2012 වර්ෂයේ දී පැවැත්වේ. මෙම විභාගයේ ප්‍රශ්න පත්‍රවල ආකෘතිය හා ස්වභාවය පිළිබඳ අවශ්‍ය විස්තර විභාග දෙපාර්තමේන්තුව මගින් සැපයෙනු ඇත.